# විසම්මුතිය මර්දනය කිරීම

## 2022 වාර්ෂික වාර්තාව



2022 ජුලි 9 වැනි දා විරෝධතාකරුවෝ ජනාධිපති ලේකම් කාර්යාලය ඇතුළත් රජයේ ප්‍රධාන ගොඩනැගිලි කිපයකට කඩා වැදුණහ. ඔවුන් ඒවා ජනාධිපති ඉල්ලා අස්වන තෙක් අත්පත් කර ගෙන සිටි අතර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වහාම රටින් පලා ගියේය. ඡයාරූපය *Left voice* අනුග්‍රහයෙනි.

INFORM Human Rights Documentation Centre
www.inform.lk

ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය 2022 වාර්ෂික වාර්තාව
2023 මැයි ප්‍රකාශයට පත් කරන ලදී
© INFORM මානව අයිතිවාසිකම් ප්‍රලේඛන කේන්ද්‍රය
කොළඹ ශ්‍රී ලංකාව
https://www.inform.lk/

*INFORM* පිහිටුවන ලද්දේ 1990 දී ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් තත්වය, විශේෂයෙන්ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයේ අධීක්ෂණය සහ ප්‍රලේඛනය සහ ප්‍රාදේශීය, ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ ලිඛිත සහ වාචික මැදිහත්වීම් තුළින් තත්වය පිළිබඳව වාර්තා කිරීම සඳහාය. *INFORM* තම අයිතිවාසිකම් නිරන්තරයෙන්ම සහ ක්‍රමානුකූලව උල්ලංඝනය කරනු ලබන ප්‍රජාවන් සමග වැඩ කිරීම කෙරේ අවධානය යොමු කරයි. දැනට. *INFORM* මැතිවරණ නිරීක්ෂණය, ප්‍රකාශ කිරීමේ නිදහස සහ මානව අයිතිවාසිකම ආරක්ෂකයන් කෙරේ ද අවධානය යොමු කරයි. *INFORM* ශ්‍රී ලංකාවේ කොළඹ පදනම්ව ඇති අතර ප්‍රාදේශීය ක්‍රියාකාරීකයන්, කණ්ඩායම් ජාලයන් සමග මෙන්ම කලාපීය (ආසියානු) සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් ජාලයන් සමග ද සමීපයෙන් වැඩ කරයි.

# පටුන


| | | |
|---|---|---|
| 1. | විධායක සාරාංශය | 4 |
| 2. | සමස්ත දැක්ම | 10 |
| 4. | මාධ්‍ය සහ ප්‍රකාශ කිරීමේ නිදහස මර්දනය කිරීම | 21 |
| 5. | රැස්වීමේ නිදහස මර්දනය කිරීම. | 26 |
| 6. | නීති සහ ප්‍රතිපත්ති වෙනස්වීම් | 36 |
| 7. | සිවිල් සමාජය මර්දනය කිරීම | 39 |
| 8. | වෙනත් සිද්ධීන් | 41 |

# 1. විධායක සාරාංශය

**ක්‍රමවේදය:** මෙම වාර්ෂික වාර්තාව පදනම්ව ඇත්තේ 2022 දී පළ කරන ලද විසම්මුතිය මර්දනය කිරීමේ මාසික වාර්තා පදනම්ව ය. විසම්මුතිය මර්දනය කිරීමට ප්‍රධාන වශයෙන් ප්‍රධාන ප්‍රවාහයේ සහ සමාජ මාධ්‍යයේ වාර්තා වූ තොරතුරු පදනම්ව ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනයට අදාල සමහර වැදගත් සිද්ධීන්වල සමහර පොදු ප්‍රව නතා සහ විස්තර ඇතුළත් වේ. මෙම වාර්තාවේ ඇතුළත් මර්දනය කිරීමේ සිද්ධීන්වලට අත් අඩංගුවට ගැනීම්, තර්ජන, බිය වැද්දීම්, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ට එරෙහි විමර්ශන යනාදිය සහ නව මර්දන නීති, පත් කිරීම්, ප්‍රතිපත්ති තිරණ යනාදි අනාගතයේ දී ප්‍රකාශ කිරීමේ, රැස්වීමේ, විසම්මුතියේ නිදහසට බලපෑ හැකි තර්ජන ද ඇතුලත් ය. මෙම වාර්තාවේ විසම්මුතිය යන්න පුලුල් වශයෙන් නිර්වචනය කර ඇත්තේ විරෝධතා, විරුද්ධත්වය දැක්වීම, එරෙහිවීම, අභියෝග කිරීම, අයිතිවාසිකම් වාර්තා කිරීම ප්‍රශ්න කිරීම හෝ තැත් කිරීම රාජ්‍ය හෝ රාජ්‍ය නොවන යාන්ත්‍රණයන්, වෙනත් අය අතර පොලීසිය, සන්නද්ධ බලකායන්, ආගමික කණ්ඩායම් දේශපාලකයන්ගෙන් සිදුවන සමාජ අසාධාරණත්වය ඇතුළත් වන සේය. ''මර්දනය'' යන්න නිර්වචනය කර ඇත්තේ ඉහත සඳහන් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසම්මුති ක්‍රියාවන් යටපත් කිරීමේ ප්‍රයත්නයක් සේය. මානව අයිතිවාසිකම් හෙළා දැකීමේ කිසියම් ප්‍රකාශයක් අයිතිවාසිකම් සෝදා පාලුවට ලක් කිරීමට ඇති හැකියාව නිසා විසම්මුතිය මර්දනය කිරීමක් සේ සැලකේ.

**සමස්ත දැක්ම:** 2022 දී ශ්‍රී ලංකාව විදේශ සංචිත සිදී යෑම සහ ඉහළ මට්ටමේ අන්තර්ජාතික ණය බර, කොවිඩ් 19 වසංගතය සහ මූල්‍ය අවකළමනාකරණය නිසා නිදහසින් පසු බරපළම ආර්ථික අර්බුදයකට මුහුණ දුන්නාය. අත්‍යාවශ්‍ය භාණ්ඩ හිගකම, නිරන්තරයෙන්ම විදුලි බලය කපා හැරීම සහ ඉහළ උද්ධමනය නිසා වීදි බට ජනතාව ජනාධිපතිට ඉල්ලා අස්වන මෙන් බල කරමින් විරෝධතා දැක් වූහ. විරෝධතා උත්සන්න වෙත්ම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ රටින් පලා ගොස් ඔවුන්ගේ සගයෙකු වූ රනිල් වික්‍රමසිංහ ඊළග ජනාධිපති වශයෙන් පත් කර ගන්නා ලදී. නව ආණ්ඩුව ආණ්ඩු විරෝධී විරෝධතාවලට සහභාගි වූ සිය ගණනක් අත් අඩංගුවට ගැනීමෙන් පෙරටත් වඩා දැඩි මර්දනකාරී පිළිවෙතක් අනුගමනය කරයි. ශ්‍රී ලංකාව දූෂණය පිළිබඳ දර්ශකයේ වඩාත් පහතට වැටුණ අතර දේශපාලකයන් සහ උසස් තනතුරු දරන දේශපාලකයින් ගණනාවක්ම අධිකරණය ඉදිරියේ පවරා ඇති දූෂණ සහ අපරාධ නඩු ගණනාවකින් නිදහස් කෙරිණ. ඉහළ මට්ටමේ දූෂණය, හමුදාකරණය සහ යුක්තිය සහ වගවීම පිළිබඳව ගැටලු රාශියක් පවතින පශ්චාත් යුදමය රටක් වන ශ්‍රී ලංකාවේ බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් විශාල සංඛ්‍යාවත් දශක ගණනාවක් තිස්සේ මුක්තියෙන් ආවරණය වී ඇත. ඔක්තෝබර් මස එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ කොමිසම ශ්‍රී ලංකාවේ තත්වය පුනරීක්ෂණය කොට ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සඳහා නව යෝජනාවක් සම්මත කළ නමුත් විදේශ ඇමති පවසන ආකාරයට ශ්‍රී ලංකාණ්ඩුව එය ප්‍රතික්ෂේප කර ඇත. පෙබරවාරි මස මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය සකස් කළ වාර්තාවකින් රටේ සිදුව ඇති උල්ලංඝනය කිරීම් ගණනාවක් ගැන බරපතළ කණස්සල්ල පළ කර ඇත.

**සිද්ධීන් යාවත්කාලීන කිරීම**: හේග් හි රැස්වූ ජනතා විනිශ්චය සභාව පුවත් පත් කතෘ ලසන්ත වික්‍රමතුංග මරා දැමීම පිළිබඳව ශ්‍රී ලංකාව වැරදිකරුයැයි තීරණය කෙළේය. 2021 අගෝස්තු මස අත් අඩංගුවට ගත් ජනමාධ්‍යවේදී කීර්ති රත්නායක මාස හයක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන සිටීමෙන් ඇප මත නිදහස් කරන ලදී. එම පනත යටතේම රඳවා ගත් මානව අයිතිවාසිකම් නීතිඥ හිජාස් හිස්බුල්ලා මාස 20 කට පසුව ඇප මත නිදහස් විය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දින 470ක් රඳවා ගෙන සිටි මඩකලපුවේ ඡායාරූප ජනමාධ්‍යවේදියෙකුට ඇප ලබා දී ඇත. 2021 මැයි මස මඩකලපුවේ අනුස්මරණ උත්සවයක් පැවැත්වීම සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත් හත් දෙනෙකු මාස හතකට ආසන්න කාලකට පසුව නිදොස් කොට නිදහස් කරන ලදී. ජනමාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීමේ නඩුවේ ප්‍රධාන සාක්ෂිකරුවෙකු තමා මහේස්ත්‍රාත් උසාවියේ දී දුන් සාක්ෂිය බොරු බවත් එම සාක්ෂිය ලබා දුන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ බලපෑම මත බවත් පැවසුවේය. වැඩි දුරටත් ඔහු විමර්ශන නිලධාරීන් හමුවීමට පෙර අතුරුදහන් මාධ්‍යවේදී එක්නැලිගොඩ ගැන කිසිම දැනුමක් නොතිබුණේයැයි කීවේය. ශ්‍රී ලංකාවේ නීතිඥ සංගමය පොලිස්පති වෙත ලිපියක් යවමින් නිසි ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකරමින් "පැහැර ගැනීමට සමාන ආකාරයකින්" අත් අඩංගුවට ගැනීම් සහ රඳවා ගැනීම් පිළිබඳව කණස්සල්ල පළ කෙළේය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දිගු කලක් රඳවා ගෙන ඇති ශිෂ්‍ය ක්‍රියාකාරීන් නිදහස් කිරීමට බල කෙරෙන උද්ඝෝෂණ ගණනාවක් පැවැත්වින. 2015 දී විරුද්ධ දේශපාලන පක්ෂක සාමාජිකයන් වෙඩි තබා මැරීම පිළිබඳව දඬුවම් නියමව සිටි ප්‍රේමලාල් ජයසේකර සහ තවත් දෙදෙනෙකු අභියාචනාධිකරණයෙන් නිදහස් කෙරිණ. හිටපු පාර්ලිමේන්තු මංත්‍රී භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මරා දැමීමට අදාලව 2021 ජුනි මස ලබා දුන් ජනාධිපති සමාව අත්හිටුවමින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දුන් අන්තර්වාර නියෝගය අනුව හිටපු පාර්ලිමේන්තු මංත්‍රී සහ නිවස සංවර්ධන අධිකාරියේ සභාපති දුමින්ද සිල්වා අත් අඩංගුවට ගෙන බන්ධනාගාර නිලධාරීන්ට භාර දෙන ලදී. 1999 දී සබරගමුව පළාත් සභාවේ හිටපු මංත්‍රී රංජිත් නන්දසේන මරා දැමීම සම්බන්ධයෙන් පවරා තිබූ නඩුවෙන් සබරගමුව පළාත් සභාවේ හිටපු මංත්‍රී හසිත සමන්ත නිදොස් කොට නිදහස් කරන ලදී. හිටපු පාර්ලිමේන්තු මංත්‍රී රන්ජන් රාමනායකට උසාවියට අපහාස කිරීම පිළිබඳව පවරා තිබූ නඩුවකින් වසර දෙකක අත්හිට වූ සිර දඬුවමක් නියම වූ අතර විනිශ්වයකරුවන් දූෂිතයැයි පැවසීම නිසා කලින් නියමව තිබූ වසර හතරක සිර දඬුවමට ජනාධිපති සමාව ලැබිණ. ආර්ථික අර්බුදය පිළිබඳව ඔවුන්ගේ වගකීම නිසා ඉදිරිපත් කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සමක් සලකා බැලූ ශ්‍රේෂ්ඨාධිකරණය මහින්ද රාජපක්ෂට සහ තවත අයට සංචාරක තහනමක් පනවන ලදී.

**මාධ්‍ය සහ ප්‍රකාශ කිරීමේ නිදහස මර්දනය:** ජනමාධ්‍යවේදීන් ගණනාවකට බාධා පමුණුවන ලද අතර සමහර සිද්ධීන් වාර්තා කිරීමට ඉඩ දුන්නේ නැත. මඩකලපුවේ ජනමාධ්‍යවේදියෙකුට විරෝධතාවයක් වාර්තා කිරීම උසාවි නියෝගයකින් තහනම් කරන ලදී. ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සතුව ඇතැයි කියන වත්කම් පිළිබඳව වාර්තා කිරීම නිසා පුවත් පත් කතෘ චමින්ද සේනාරත්නට මරණ තර්ජන එල්ල විය. නීති විරෝධී ව්‍යාපාරයක් පිළිබඳ දර්ශන නිකුත් නොකරන්නැයි දේශපාලකයෙකු විසින් ප්‍රාදේශීය වාර්තාකරුවෙකුට තර්ජනය කර ඇත. IBC දෙමළ වෙබ් අඩවියේ ජනමාධ්‍යවේදී ලක්ෂ්මන් දේවපතිරන් ට රාජ්‍ය ඇමතිවරයෙකුගේ දේශපාලන ආධාරකරුවන් විසින් පහර දී ඇත. මාර්තු 31 වැනි දා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ පුද්ගලික නිවස ඉදිරිපිට පැවති විරෝධතාවය ආවරණය කරමින් සිටි ජනමාධ්‍ය වේදීන් අඩුම වශයෙන් හය දෙනෙකු අත් අඩංගුවට ගත් අතර තවත්

ජනමාධ්‍යවේදීන් නමයක් සහ විරෝධතාකරුවන් සිය ගණනකට පොලීසියෙන් සහ හමුදාවෙන් පහර දී ඇත. ඊට පසු දින විරෝධතාවය පැවතිය දී සිදුව ඇති හානිය වාර්තාකරමින් සිටි ජනමාධ්‍ය වේදීන්ට ජනාධිපති මාධ්‍ය අංශයේ අධ්‍යක්ෂකවරයෙකු තර්ජනය කෙළේය. එම විරෝධතාවය පිළිබඳ තොරතුරු විකාශනය කළ පුද්ගලික රූපවාහිනි නාලිකාවට එරෙහිව පරීක්ෂණයක් පැවැත්වීමට පොලිස්පති නියෝග කෙළේය. ජූලි මස ගෝටාගෝගමට එල්ල කළ හමුදා ප්‍රහාරය ආවරණය කරමින් සිටි ජනමාධ්‍යකරුවන් අවම වශයෙන් පස් දෙනෙක් පහර කෑමට ලක් වූහ. සමහරු අත් අඩංගුවට ගෙන වද හිංසා පමුණුවන ලද අතර ඔවුන්ගේ දුර කතන අත් අඩංගුවට ගෙන හමුදාව විසින් ඒවායේ වාර්තා බලහත්කාරයෙන් මකා දමා ඇත. ජූලි මාසයේ අගමැති රනිල් වික්‍රමසිංහ ගේ නිවස ඉදිරිපිට පැවති තත්වය ආවරණය කරමින් සිටි ජනමාධ්‍යවේදීන්ගෙන් අවම වශයෙන් අට දෙනෙකු පහර කෑමට ලක් වූහ. සමාජ ජනමාධ්‍යවේදියෙකු ආණ්ඩුව අපහාසයට ලක් කෙරෙන්නේයැයි කියන තොරතුරු පළ කිරීම සම්බන්ධයෙන් කැඳවා ප්‍රශ්න කරන ලදී. මුහුණු පොතේ කළ සඳහනක් පිළිබඳව සමාජ මාධ්‍යවේදියෙකු කැඳවා පැය පහක් ප්‍රශ්න කළ අතර තවත් සමාජ මාධ්‍යවේදීන් කීප දෙනෙකු ඔවුන්ගේ යූටියුබ් නාලිකාවල පළ වූ තොරතුරු ගැන කැඳවා ප්‍රශ්න කරන ලදී. අධ්‍යාපන ආයතනයකින් ගොණු කරන ලද පැමිණිල්ලක් පිළිබඳ වාර්තාවක් යූ ටියුබ් නාලිකාවෙන් ඉවත් කරන්නැයි අධිකරණයෙන් නියෝග කෙරිණ. ආණ්ඩුවේ රූපවාහිනී සමාගමක සේවය කරන සහ ගුරුවරියක් වන බදුල්ලේ ජනමාධ්‍යවේදිනියක් සමාජ මාධ්‍ය යේ ආණ්ඩුව විවේචනය කෙළේයැයි සේවයෙන් පහ කොට ඇත. ජනමාධ්‍යවේදීන් ගණනාවක්, සමාජ මාධ්‍ය නිර්මාණකරුවන් සහ ක්‍රියාකාරීන් ගණනාවක් ආණ්ඩු විරෝධී ව්‍යාපාරවලට සහයෝගය දීම නිසා පොලිසියෙන් කැඳවා ප්‍රශ්න කරන ලදී. විදුලි සංදේශන නියාමන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල් ගේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් අනුව සමාජ මාධ්‍යය තාවකාලිකව නතර කරන ලදී. රූපවාහිනි වැඩ සටහන් සම්පාදිකාවක් ඇතුළත් සමාජ මාධ්‍ය කණ්ඩායම්වල පාලකයන් තිදෙනෙකු විරෝධතාවයක් තුළ සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට අත් අඩංගුවට ගෙන ඇත. රජයේ සේවකයින්ට තම අදහස් සමාජ මාධ්‍ය හරහා හුවමාරු කර ගැනීම නතර කරන්නැයි ආණ්ඩුවෙන් නියෝග කෙරිණ. ආණ්ඩුව විවේචනය කිරීම නිසා රාජ්‍ය නිලධාරීන් කීප දෙනෙකු අත් අඩංගුවට ගෙන විනය පරීක්ෂණ පැවැත්වීමට නියෝග කර ඇත. එක්තරා ගමක ළමා මන්දපෝෂණයේ විශාල වැඩිවීමක් ගැන මාධ්‍යයට ප්‍රකාශයක් කළ ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු ද ඒ අතර වේ. පාලක පක්ෂයේ පාර්ලිමේන්තු මංත්‍රීන් තිදෙනෙකු පාර්ලිමේන්තු වාර්තාකරුවන් දෙදෙනෙකුට පහර දී තර්ජනය කොට ඔවුන්ගේ ජංගම දුර කතන පැහැර ගත්තේයැයි ද වාර්තා වේ. අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරේපත්තු හි පොලීසිය සහ ගම්වාසීන් අතර හට ගත් ගැටුමක් වාර්තා කරමින් සිට ජනමාධ්‍යවේදියෙකුට පොලීසියෙන් පහර දී ඇත. අවස්ථා කීපයකදීම තෙල් පෝලිම්වල පැවති උණුසුම්කාරී තත්වය වාර්තා කරමින් සිටි ජනමාධ්‍යවේදීන්ට පහර දී ඇත. නොවැම්බර් මස දිනයක මුලතිවු හි ජනමාධ්‍ය වේදීන්ගේ සමාජ ශාලාවට ගිය හමුදාවේ හට කණ්ඩායමක් එම කේන්ද්‍රයේ ප්‍රධානීන්ගේ තොරතුරු ලබා දෙන මෙන් ඉල්ලා සිටියහ.

**රැස්වීමේ නිදහස මර්දනය:** වාමාංශික දේශපාලන පක්ෂයක සාමාජිකයන් පිරිසක් සෝදිසියට, තර්ජනවලට සහ හිරිහැර කිරීම්වලට ලක් වූහ. පොලීසිය කොළඹ තවත් වාමාංශික දේශපාලන පක්ෂයක කාර්යාලයකට කඩා වැදීමට උත්සාහ කෙළේය. පාර්ලිමේන්තු මංත්‍රී රාසමානික්කම්ට විරෝධතාවයකට සහභාගිවීම වැළැක්වීමට අධිකරණ නියෝගයක් නිකුත් කර ඇත. වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයක් ගැනිමට සූදානම් වූ වෘත්තීය සමිතියකට සහ එහි සභාපතිට එරෙහිව අධිකරණ

නියෝගයක් ලබා ගෙන ඇත. වෘත්තීය සමිති නායකයන් සෝදිසියට ලක් වන අතර විරෝධතාවන්ට ඔවුන්ගේ සහභාගිත්වය ගැන පොලීසියෙන් ප්‍රශ්න කරයි. විරෝධතාවයක් සැලසුම් කරන විට උතුරු පළාතේ කිලිනොච්චියේ රාජ්‍ය නොවන සංවිධානයකට පොලීසිය කඩා වැදී ඇත. පොලීසිය කම්කරු සංගමයක්, අතුරුදහන් වූවන්ගේ පවුල්, කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිණියන්, හමුදාවෙන් ඉඩම් අත්පත් කරගැනීමට විරෝධතා දැක්වූවන්, උතුරු නැගෙනහිර සහ කොළඹ අනුස්මරණ රැස්වීම් සහ විරෝධතා පැවැත් වූ විශාල සංඛ්‍යාවකට බාධා පමුණුවා විසිරුවා හැරියේය. අනුස්මරණ උත්සව සහ විරෝධතා ගණනාවක් තහනම් කරමින් අධිකරණයෙන් නියෝග නිකුත් තර ඇත. ශිෂ්‍යයන් සංවිධානය කළ විරෝධතා ඇතුලු ආණ්ඩු විරෝධී විරෝධතා ගණනාවකට කඳුලු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කරන ලදී. ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ රඹුක්කන පැවැත් වූ ආණ්ඩු විරෝධී රැලියකට පොලීසිය සජීවී උණ්ඩ යොදා වෙඩි තැබීමෙන් එක පුද්ගලයෙකු මිය ගිය අතර තවත් 14කට තුවාල සිදු විය. ඉන්ධන ඉල්ලා පැවති විරෝධතාවයක දී පොලීසියේ ත්‍රිරෝද රථයකට අලාභ හානි කිරීම සම්බන්ධයෙන් චෝදනා ලත් විරෝධතාකරුවෙකුට බරපතළ වැඩ සහිතව වසර තුන හමාරක සිර දඬුවම් නියම විය. අන්තර්ජාතික මූල්‍ය සංවිධානයේ රැස්වීමක් පැවැත්වීමට නියමිත ආණ්ඩුවේ ගොඩනැගිලි දෙකක පිවිසුම් දොරටුව අවහිර කළ විරෝධතාකරුවන් 21 අත් අඩංගුවට ගන්නා ලදී. විරෝධතාකරුවන් විසින් ජනාධිපතිට ඉල්ලා අස්වීමට බල කරමින් ආණ්ඩුවේ වැදගත් ගොඩනැගිලි කීපයක් අත්පත් කර ගැනීමෙන් සති දෙකකට පසු හමුදාව ජූලි 22 වැනි දා අත්පත් කර ගෙන තිබූ ගොඩනැගිලිවලට කඩා පැන විරෝධතාකරුවන් බලහත්කාරයෙන් පලවා හරින ලදී. විරෝධතාකරුවන් සාමකාමීව පිටව යෑමට එකඟ වී සිටියදී එල්ල කළ මෙම හදිසි ප්‍රහාරය නිසා 50 කට අධික සංඛ්‍යාවකට තුවාල සිදු වූ අතර 9ක් අත් අඩංගුවට ගෙන ඇත. ශිෂ්‍ය ව්‍යාපාරයේ ක්‍රියාකාරිකයෙකු පැහැර ගෙන ගොස් ප්‍රකට ශිෂ්‍ය ක්‍රියාකාරිකයෙකු පිළිබඳව ප්‍රශ්න කර මහමග දමා ගොස් තිබිණ. විරෝධතා ව්‍යාපාරයේ නායකයන් කීප දෙනෙකුම පැහැර ගැනීමට සමාන ආකාරයෙන් ගෙන ගොස් පොලීසිය පසුව ඔවුන් අත් අඩංගුවට ගත් බව නිවේදනය කෙළේය. ගාලු මුවදොර විරෝධතාවයට සහභාගි වූ විරෝධතාකරුවන් 27කට සංචාරක තහනම් පනවන ලදී. මැයි මස කොළඹ විරෝධතා පැවති ස්ථානයට කඩා වැදුණ පොලීසිය එහි සිටි අයට පහර දුන්හ. ජූලි මස ඇඹිලිපිටියේ විරෝධතා පැවති ස්ථානයට කඩා වැදුණ මැර පිරිසක් එහි සිටි පිරිසට පහර දී දේපොළ විනාශ කළහ. ජූලි මාසයේ දී ජනාධිපති ලේකම් කාර්යාලයට නඩා වැදුණ විරෝධතාකරුවන් සිය ගණනත් අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී අත් අඩංගුවට ගෙන තිබිණ. අගෝස්තු මාසයේ දී අන්තර් විශ්ව විදයාල ශිෂ්‍ය පෙරමුණේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ සහ අන්කර් විශ්ව විද්‍යාල භික්ෂු පෙරමුණේ කැඳවුම්කරු ගලේවෙල සිරිධම්ම හිමි තවත් 16ක් සමග අත් අඩංගුවට ගන්නා ලදී. මුදලිගේ සහ සිරිධම්ම හිමි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස ගණනාවක් අත් අඩංගුවේ සිටියහ. මෙම ක්‍රියාකාරීන් නිදහස් කරන මෙන් ඉල්ලා පැවැත් වූ විරෝධතාවය කඳුලු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කිරීමෙන් විසිරුවා හරින ලදී. එම මාසයේම තවත් 17ක් අත් අඩංගුවට ගන්නා ලදී. පැරීසියේ දී ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට සහාය දක්වමින් පෙළපාලි සංවිධානය කළ දෙමළ-ප්‍රංශ වැසියෙකු ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවක අත් අඩංගුවට ගෙන ඇත. ශ්‍රී ලංකාවේ විරෝධතා ව්‍යාපාරයට සහාය දැක් වූ බ්‍රිතාන්‍ය සමාජ මාධ්‍ය ක්‍රියාකාරිණියක් අත් අඩංගුවට ගෙන ඇගේ වීසා බලපත්‍රය අවලංගු කොට ආපසු යෑමට බල කෙරිණ. ජනාධිපති රනිල් වික්‍රමසිංහ කොළඹ නගරයේ බොහෝ ප්‍රදේශ ඇතුළත් වන සේ අධි ආරක්ෂක කලාපයක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සැප්තැම්බර් මස පොලිස් පහර දීම්වලින් විරෝධතාකරුවන් 84ක් අත් අඩංගුවට ගත් අතර ඉන් 7ක් රෝහල් ගත කෙරිණ.

**නීති සහ ප්‍රතිපත්ති වෙනස්වීම්:** ශ්‍රී ලංකාවේ පැවති විරෝධතා නිසා 2022 අප්‍රේල් සිට ජූලි දක්වා මාස තුනකට හදිසි නීතිය ප්‍රකාශයට පත් කෙරිණ. ඒ සමගම ප්‍රසිද්ධ මාවත් ඇතුළත් ප්‍රසිද්ධ ස්ථානවලට මහජනතාව රැස්වීම තහනම් කරමින් ඇඳිරි නීතිය පනවන ලදී. ජූලි සහ සැප්තැම්බර් යන මාස දෙකේ හැර වසර පුරාම මාසිකව ගැසට් නිවේදනවලින් මහජන සාමය ඇති කිරීමට සන්නද්ධ හමුදා කැඳවීමෙන් හමුදාකරණයේ ලක්ෂණ පෙන්නුම් කෙරිණ. 2022 ජනවාරි මස පළාත් පාලන මැතිවරණය තවත් වසරකින් කල් දමන ලදී. ත්‍රස්තවාදයේ සහ ත්‍රස්තවාදී මූලාශ කටයුතුවල යෙදෙන්නේයැයි චෝදනා කොට තහනම් කර තිබූ දෙමළ ඩයස්පෝරා සංවිධාන හයක තහනම ශ්‍රී ලංකාව ඉවත් කරන ලදී. එම ලැයිස්තුවට කවියෙකු වන අහ්නාෆ් ජසීම් අලුතින් ඇතුළත් කර ඇත. පාර්ලිමේන්තු මංත්‍රීන්ගේ වත්කම් ප්‍රකාශන පිළිබඳ තොරතුරු නිකුත් කිරීමට තොරතුරු දැනගැනීමේ කොමිසම කළ නියෝගයට එරෙහිව පාර්ලිමේන්තු මහ ලේකම් අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කෙළේය. පුද්ගලික දත්ත ආරක්ෂා කිරීමේ පනත පාර්ලිමේන්තුවෙන් සම්මත විය. ඒ අනුව ජනමාධ්‍ය වේදීන්ගේ තොරතුරු දැන ගැනීමේ අයිතියට සීමා පැන වේ. සැප්තැම්බර් මස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගෙන රඳවා ගෙන ඇති අය පිළිබඳ තොරතුරු නිකුත් කිරීමට තොරතුරු දැන ගැනීමේ කොමිසමෙන් පැවැත් වූ විභාගයක දී කළ ඉල්ලීම ශ්‍රී ලංකා පොලීසිය ප්‍රතික්ෂේප කෙළේය. 2022 ජනවාරි මස ආණ්ඩුව දරදඬු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට එක් කළ සංශෝධන කීපයක් ගැසට් කරන ලදී. එහෙත් මානව අයිතිවාසිකම් කණ්ඩායම් ප්‍රකාශ කළ ආකාරයට එම සංශෝධන අවම මට්ටමේ ඒවා වන අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ගැටලු අවම වශයෙන් හෝ ආමන්ත්‍රණය නොකරන අතර ප්‍රමාණවත් වන්නේ නැත. 2022 අගෝස්තු මස ශ්‍රී ලංකාවේ අධිකරණ ඇමති විවාදයට ලක් වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට වඩාත් ලිහිල් වූ ප්‍රතිපාදන සහිත නව ජාතික ආරක්ෂක පනතක් හඳුන්වාදීම ප්‍රකාශයට පත් කෙළේය. සැප්තැම්බර් 23 වැනි දා රාජ්‍ය රහස් පනත යටතේ රජයේ ප්‍රධාන ගොඩනැගිලි ගණනාවක් ඇතුළත් වන ආකාරයෙන් කොළඹ අධි ආරක්ෂණ කලාපයක් ප්‍රකාශ කිරීමේ ගැසට් නිවේදනයක් නිකුත් කෙරිණ. මානව හිමිකම් කොමිසම ඇතුළත් බොහෝ දෙනකු මෙම පියවරේ නීති විරෝධී ස්වභාවය පෙන්වා දීම නිසා එය ඉවත් කෙරිණ. සැප්තැම්බර් මස පුනරුත්ථාපන කාර්යාංශය පනත යනුවෙන් විවාදයට ලක් වූ කෙටුම්පතක් ගැසට් කරන ලදී. අධිකරණ ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකර මෑතක දී විරෝධතා ව්‍යාපාරයට සම්බන්ධ වුවන් බලහත්කාරයෙන්ම පුනරුත්ථාපන ක්‍රියා පටිපාටියකට ලක් කිරීම මෙම පනතින් අරමුණු කර ගෙන ඇති බව මානව අයිතිවාසිකම් ක්‍රියාකාරීන් සහ තවත් අය පෙන්වා දුන්හ. වෘත්තීය සමිති පියවර ගැනීම වැළැක්වීමට ජනාධිපති සමහර සේවාවන් අත්‍යාවශ්‍ය බව අවස්ථා කිපයකදීම වරින් වර ප්‍රකාශයට පත් කෙළේය.

**සිවිල් සමාජය මර්දනය කිරීම:** වෘත්තීය සමිති ක්‍රියා මාර්ග හෙළා දකිමින් ආණ්ඩුවේ ඇමතින් සහ මංත්‍රීන් ප්‍රශ්නගත ප්‍රකාශන ගණනාවක් නිකුත් කළ අතර වැඩ වර්ජන තහනම් කිරීමේ පනතක් යෝජනා කරන බව සඳහනි. ජනාධිපති රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුව අමතමින් මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සරදමට ලක් කොට මානව හිමිකම් කොමිසමට පොලීසියේ හෝ ආරක්ෂක හමුදාවල රාජකාරියට බාධා කළ නොහැකියැයි කීවේය. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණය ඉටු කරන්නැයි ඉල්ලා සිටි ප්‍රකට සමාජ ක්‍රියාකාරිකයෙකු අත් අඩංගුවට ගෙන ඇත. සමාජ ක්‍රියාකාරීන් කීප දෙනෙකුම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා පැය ගණනාවක් ප්‍රශ්න කර ඇති අතර ඉන් සමහරෙකු නිරන්තර සෝදිසියට ලක් කෙරේ. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ පොලිස් නිලධාරීන් රාජ්‍ය නොවන සංවිධාන ගණනාවකට ගොස් කාර්ය මණ්ඩලය සහ

අරමුදල් ලබා දෙන අය පිළිබඳ විස්තර ඉල්ලා ඇත. මඩකලපුවේ සිවිල් සමාජ සංවිධාන මණ්ඩපයේ සභාපති සැප්තැම්බර් සහ ඔක්තෝබර් යන මාස දෙකේදීම අවස්ථා කීපයක දී කැඳවා ඇත. විරෝධතාකරුවන් ජනාධිපති ලේකම් කාර්යාලය සහ වෙනත් ගොඩනැගිලි අත්පත් කර ගත් ජුලි 9 වැනි දා වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට තමා සාවද්‍ය ලෙස සම්බන්ධ කිරීමට පොලීසිය උත්සාහ කරන්නේයැයි සඳහන් කරමින් සමාජ ක්‍රියාකාරිකයෙකු මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොණු කර ඇත.

**වෙනත් සිද්ධීන්:** තමා තනතුරෙන් ඉවත් කිරීමට දේශපාලකයෙකු උත්සාහ කරන්නේයැයි ඉඩම් කොමසාරිස් පැවසුවේය. මාධ්‍ය සාකච්ඡාවලදී ආණ්ඩුව විවේචනය කිරීම නිසා ලිට්‍රෝ ගෑස් සමාගමේ සහ මහජන උපයෝගිතා කොමිසමේ සභාපතිවරුන්ට එරෙහිව පියවර ගැනීමට ආණ්ඩුව සූදානම් වන බව වාර්තා විය. අප්‍රේල් මස මුහුණු ආවරණය කර ලියා පදිංචි අංක රහිත මෝටර් සයිකල්වලින් පැමිණි හමුදා භට පිරිසක් විරෝධතාකරුන්ට තර්ජනය කිරීමෙන් වැළැක්වූ පොලිස් නිලධාරීන්ට එරෙහිව පියවර ගන්නැයි හමුදාපති පොලිස්පතිගෙන් ඉල්ලීමක් කෙළේය. ආණ්ඩුවෙන් බෙදා හරින ලද පෝෂණ අතිරේකයක ඉහළ මට්ටමේ ඇප්ලොටොක්සින් සොයා ගැනීම හෙළි කළ සෞඛ්‍ය වෘත්තීය සමිති නායකයන්ට එරෙහිව පියවර ගන්නා බවට සෞඛ්‍ය ඇමති තර්ජනය කෙළේය. වාර්ගික සුළුතරයට අයත් පාර්ලිමේන්තු මංත්‍රීන් දෙදෙනෙකු තමන් පසු පස බුද්ධි නිලධාරීන් පැමිණෙන බව වාර්තා කළහ. පෙබරවාරි මස දෙමළ දේශපාලන පක්ෂයක තරුණ අංශයේ සහකාර ලේකම් කෙනෙකු පැහැර ගෙන යෑමට තැත් කරන ලදී. සැප්තැම්බර් මස මඩකලපුවේ මානව අයිතිවාසිකම් ක්‍රියාකාරිණියක් සහ TNA දෙමළ දේශපාලන පක්ෂයේ සාමාජිකාවක් පොලීසියේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට කැඳවා ප්‍රශ්න කරන ලදී.

# 2. සමස්ත දැක්ම




වසරේ බොහෝ කාලයක් කිලෝමීටර් ගණන් දිග ඉන්ධන පෝලිම් ශ්‍රී ලංකාවේ සුලභ දර්ශනයකි. ඡායාරූපය *FT* අනුග්‍රහයෙනි

**ආර්ථික අර්බුදය**: විදේශ සංචිත නොමැතිවීම සහ ඉහළ විදෙස් ණය අනුපාතය නිසා හට ගත් ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය කොවිඩ් 19 වසංගතයෙන් සහ මූල්‍ය අවකළමනාකරණය නිසා ආණ්ඩුවට ආනයන පාලනය කිරීමට සිදුවීමෙන් ඉහළ මිල උද්ධමනය, නිරන්තර විදුලි බලය කපා හැරීම, ඉන්ධන හිගය, ගෘහස්ථ ගෑස් හිගය, ඖෂධ සහ වෙනත් අත්‍යවශ්‍ය දේ හිගයට හේතු විය. මෙම තත්වය නිසා මන්දපෝෂණය සහ සාගින්න වැඩි වූ බව සියලු සමීක්ෂණවලින් පෙන්නුම් කෙරිණ. විදෙස් ණය ආපසු ගෙවීම අත්හිටුවීම නිසා මූඩි ආයෝජන සේවාව ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම **Ca** සිට **Caa2** දක්වා පහත හෙළන ලදී. රෝහල්වල අත්‍යවශ්‍ය ඖෂධ නොමැතිවීම නිසා මාර්තු මාසයේ දී සමහර සැත්කම් තාවකාලිකව නතර කරන ලදී. සාමාන්‍ය වාර්ෂික උද්ධමන අනුපාතය 46% ක් වූ අතර ප්‍රවාහන වියදම් සහ ආහාර උද්ධමන අනුපාතය පිළිවෙළින් 132% සහ 64% විය. [1] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දිවයින පුරා පවත්වන ලද සමීක්ෂණයකින් ජනතාවගෙන් 79% ක් තම ආර්ථික තත්වය පෙර වසර හා සසඳන විට පහත වැටී ඇති බව පැවසූහ.[2] ලෝක ආහාර සංවිධානය ශ්‍රී ලංකාවේ පවුල්වලින් 37% උග්‍ර ආහාර අනාරක්ෂිත භාවයකට මුහුණ දී ඇති බවත් පවුල් 41% ප්‍රමාණයක් ආහාර වේල් ගණන අඩු කර ඇති බවත් වාර්තා කෙළේය.[3] අත්‍යවශ්‍ය ඖෂධ 150ක ප්‍රමාණයක හිගයක් පවතින බව මාධ්‍ය වාර්තාවල පළ විය.

---

1 https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/press/pr/press_20221230_inflation_in_december_2022_ccpi_e.pdf

2 https://srilankabrief.org/79-of-sri-lankans-economic-situation-has-got-worse-during-the-last-year/

3 https://docs.wfp.org/api/documents/WFP-0000145643/download/?_ga=2.25620920.407229744.1675774438-458050933.1675774438

**දූෂණය:** ශ්‍රී ලංකාව දූෂණය පිළිබද දර්ශකයේ 2022 ජනවාරියේ 94 සිට 101 දක්වා පහත වැටුණ[4] අතර 2023 ජනවාරියේ දී 102 දක්වා පහත වැටිණ.[5] දේශපාලකයන් සහ ආණ්ඩුවේ උසස් නිලධාරීන් අඩුම වශයෙන් නඩු 7කින් නිදහස කෙරිණ.[6] නඩුව ගොණු කිරීමේ දී සියලුම කොමසාරිස්වරුන් අත්සන් කර නොතිබීමේ හේතුවෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශනය කිරීමේ කොමිසමෙන් පවරා තිබූ නඩු දෙකක් ඉල්ලා අස් කර ගන්නා ලදී. ඉන් එකක් වන්නේ හිටපු මහාමාර්ග ඇමති ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිවරණ වැඩවලට ආණ්ඩුවේ සේවකයන් යොදවා ගැනීම පිළිබඳව කොමිසම නැවත ගොණු කර තිබූ නඩුවකි. දිවි නැගුම ව්‍යාපාතිය සහ රජයේ මුදල්වලින් ඉඩම් මිලදී ගැනීම පිළිබඳව ජනාධිපති ගේ සොහොයුරු බැසිල් රාජපක්ෂට එරෙහිව පවරා තිබූ නඩු දෙකක් නීතිපති ඉල්ලා අස්කර ගත්තේය. එක නඩුවක දී පැමිණිලිකරු සාධාරණ සැකයෙන් තොරව චෝදනා ඔප්පු කිරීමට අසමත් වූයේයැයි අධිකරණයෙන් තින්දු කෙරිණ.[7] මහබැංකු බැදුම්කර පිළිබද රවි කරුණානායකට එරෙහි නඩුව මහජන දේපොළ පනත යටතේ පවත්වා ගත නොහැකි බව අභියාචනාධිකරණයෙන් තිරණය කළ නිසා අවසන් විය. හිටපු මහබැංකු අධිපතිට එරෙහි තවත් නඩුවක් පැමිණිලිකරු විසින් ඉල්ලා අස් කර ගන්නා ලදී.[8] වෙනත් නඩුවක දී හිටපු ඇමති සහ පාර්ලිමේන්තු මංත්‍රී ප්‍රසන්න රණතුංග මහතා රජයේ ඉඩමක අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට ව්‍යාපාරිකයෙකුගෙන් රු. දශලක්ෂ 64ක අල්ලසක් ලබා ගැනීමට තර්ජනය කිරීමට වැරදිකරුබව ඔප්පුවී වසර දෙකක අත්හිටවූ සිර දඩුවමක් නියම කෙරිණ. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමේ කොමසාරිස්වරුන් දෙදෙනෙකු බලවත් දේශපාලකයන් සහ උසස් නිලධාරීන් ට එරෙහිව පවතින නඩු 19ක් ඉල්ලා අස්කර ගැනීමට හෝ බාධා කිරීමට පියවර ගන්නා බව ඩේලිමිරර් පත්‍රය වාර්තා කරයි. මින් නඩු 13ක් රාජපක්ෂ පවුලේ සාමාජිකයන් සම්බන්ධයෙනි. කොමිසමේ සාමාජිකයෙකු වන චන්ද්‍රා නිමල් වාකිස්ට තම උපදෙස් පිළිනොපැදීම ගැන නීති නිලධාරියෙකුට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වන බවට තර්ජනය කෙළේයැයි වාර්තා වේ. ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය පිළිබදව වගවීම සම්බන්ධයෙන් හිටපු රාජපක්ෂ ආණ්ඩුවේ ප්‍රධාන දේශපාලකයන් සහ නිලධාරීන් කීප දෙනෙකුට 2022 අගෝස්තු මස සිට සංචාරක තහනමක් පනවා ඇත.

**වගවීම:** 2012 වැලිකඩ බන්ධනාගාරයේ ඝාතනය සම්බන්ධයෙන් හිටපු බන්ධනාගාර කොමසාරිස් එමිල් ළමාහේවාට මරණ දඩුවම නියම වූ අතර අනෙක් සැකකරුවන් නිදහස් කෙරිණ. තීන්දුව ලැබීමට නියමිතව තිබිය දී එම නඩුවෙහි ප්‍රථම සැකකරු වූ පොලිස් පරීක්ෂක නියොමාල් රංගජීවට උසස්වීමක් ලබා දීමෙන් මෙම නඩුවට තිබිය හැකි දේශපාලන මැදිහත්වීම් පෙන්වයි. මාධ්‍ය

[4] https://www.newsfirst.lk/2022/01/25/sri-lanka-drops-from-94-to-102-in-corruption-perceptions-index/

[5] https://www.newsfirst.lk/2023/02/01/sri-lanka-ranked-101-in-corruption-perception-index-2022/

[6] (1) ඡන්ද ව්‍යාපාරයට සතොස සේවකයන් යොදවා ගැනීම පිළිබඳව අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දුට සහ තවත් අයට එරෙහිව පැවති නඩුව (2) සමෘද්ධිලාභීන්ට වන්දි සහ පාරිතෝෂික ගෙවීමට දිවි නැගුම ව්‍යාපෘතියේ අරමුල් අවභාවිතය. (3) 2015 මැතිවරණයේ දි මහින්ද රාජපක්ෂගේ ඡායා රූපය හොදා ලිත් මුද්‍රණයට දිවි නැගුම අරමුදල් අවභාවිතය. (4) ශ්‍රී ලාකා රූපවාහිනී සංස්ථාවට GI බට මිලදී ගැනීම පිළිබඳව හිටපු ඇමති කෙහෙලිය රඹුක්වැල්ලට එරෙහි නඩුව. (5) හිටපු ඇමති රවි කරුණානායකට එරෙහි මහ බැංකු බැදුම්කර නඩුව. ( 6) හිටපු මහබැංකු අධිපති කබ්බ්‍රාල් ට එරෙහිව ඔහුගේ පාලන කාලය තුළ සිදු වූ මුල්‍ය අක්‍රමිකතා පිළිබද පුද්ගලික නඩුව.(7) බැසිල් රාජපක්ෂට එරෙහි මල්වාන ඉඩම් නඩුව

[7] 7 2015 මැතිනරණයේ දී මහින්ද රාජපක්ෂගේ ඡයාරූපයක් යොදා ලිත් දශලක්ෂයක් මුද්‍රණය කිරීමෙන් මගනැගුම ව්‍යාපෘතියට රු. දශ ලක්ෂ 29.4 ක අලාභයක් සිදු විය.

[8] https://www.dailymirror.lk/print/news/Ajith-Nivard-Cabraal-released-from-a-case/239-252975

අයිතිවාසිකම් කණ්ඩායම් සහ පැහැරගත් සහ ඝාතනය කරන ලද ජනමාධ්‍යවේදීන්ගේ පවුල්වල සාමාජිකයන් කලු ජනවාරිය අනුස්මරණය කෙළේ ඝාතනය කළ ජනමාධ්‍ය වේදීන්ට යුක්තිය සහ මාධ්‍ය සේවකයන්ට එරෙහිව සිදු කළ අපරාධ සම්බන්ධයෙන් දශක ගණනාවක් තිස්සේ පවතින මුක්තිය අවසන් කිරීමට ඉල්ලීමෙනි. මැයි මස උතුරු, නැගෙනහිර සහ කොළඹ යුද්ධයේ වින්දිතයන් සහ රාජපක්ෂ පවුලේ සාමාජිකයෙකු සමග ඇති කර ගත් ආරවුලක් නිසා කුරිරු ලෙස ඝාතනය කළ වසීම් තජුඩීන් සිහිපත් කිරීමට අනුස්මරණ උත්සව පවත්වන ලදී. දෙසැම්බර් මස මඩකලපුවේ පාර්ලිමේන්තු මංත්‍රී රාජසිංහම් ඝාතනය කිරීමේ 17 වැනි සංවත්සරය මඩකලපුවේ දී පවත්වන ලදී. එය දණ්ඩ මුක්තිය නිසා යුක්තිය ඉටු වී නැති තවත් සිද්ධියකි. පරරාජසිංහම් ඝාතනය කිරීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු නීතිපති නඩුව ඉල්ලා අස්කර ගැනීම නිසා 2021 දී නිදහස් කෙරිණ. වවුනියාවේ මහාධිකරණය සුවිශේෂ නියෝගයක් නිකුත් කරමින් 2009 සිවිල් යුද්ධය අවසානයේ දී භාර වූ එල්ටීටීඊ සමාජිකයින් ලබන වසරේ මාර්තු මාසය වන විට ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා හමුදාවට දන්වා සිටියේය, බොහෝ විට ඔවුන් මරා දමන්නට ඇතැයි සැලකේ. [9]

**අන්තර්ජාතික ප්‍රජාව:** මානව අයිතිවාසිකම් පිළිබඳ UNHCR 49 වැනි සැසිය පෙබරවාරි 28 ආරම්භ විය. පෙබරවාරි මස මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයෙන් නිකුත් කර ඇති වාර්තාවෙන් රටේ සිදුව ඇති උල්ලංඝනය කිරීම් ගණනාවක් ගැන බරපතළ කනස්සල්ල පළ කර ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට ඉදිරිපත් කර ඇති සංශෝධන වැදගත් පියවරක් වශයෙන් පිළිගෙන ඇති අතර පනතේ වඩාත්ම ප්‍රශ්නගත ප්‍රතිපාදන එසේම පවතින නිසා යෝජිත වෙනස්කම් ප්‍රමාණවත් නොවන බව පෙන්වා දී ඇත. අගෝස්තු මස මානව අයිතිවාසිකම් පිළිබඳ විශේෂඥයන් නිකුත් කර ඇති නිවේදනයකින් ශ්‍රී ලංකාවේ බලධාරීන් 2022 අප්‍රේල් සිට සාමකාමී විරෝධතා යටපත් කිරීමට විස්තීර්ණව, දිර්ඝකාලීනව සහ නැවත නැවතත් හදිසි නීති යොදා ගැනීම හෙළා දැක ඇත. ජිනීවා හි එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් මණ්ඩලය ඔක්තොබර් මස මුල දී ශ්‍රී ලංකාවේ සංහිදියාව, වගවීම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය පිළිබඳ යෝජනාව මානව අයිතිවාසිකම් මණ්ඩලයේ 51 සැසියේ දී සම්මත කර ඇත. එම යෝජනාවෙන් මානව අයිතිවාසිකම් අපහරණ පිළිබඳ වගවීමේ පවතින ගැටලු, පවතින ආර්ථික සහ දේශපාලන අර්බුදය සහ කොවිඩ් 19 සන්දර්භයේ අලුතින් මතු කරන අභියෝග සැලකිල්ලට ගෙන ඇත. ශ්‍රී ලංකාවේ අනුමැතිය හෝ උපදේශනයක් නොමැතිව ඉදිරිපත් කර ඇති රටේ මානව අයිතිවාසිකම් තත්වය පිළිබඳ යෝජනාව ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බව විදේශ කටයුතු ඇමති අලි සබ්‍රි ප්‍රකාශ කෙළේය. නොවැම්බර් මස හිටපු අගමැති සහ ජනාධිපති මහින්ද රාජපක්ෂ පාර්ලිමේන්තුවේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය යටපත් කිරීමේ දේශීය සහ විදේශීය කුමන්ත්‍රණයක් පවතින්නේයැයි ප්‍රකාශ කෙළේය.

**විරෝධතා:** වසර 2022 ශ්‍රී ලංකාවේ විරෝධතා වසරකි. ආර්ථික අර්බුදය, අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟකම සහ ඔවුන් මුහුණ දී ඇති වෙනත් ගැටලු නිසා ජනතාව ආණ්ඩුවට ඉල්ලා අස්වීමට සහ දැවෙන ප්‍රශ්නවලට විසඳුම් ඉල්ලා වීදි බැස විරෝධතා දැක් වූහ. මාර්තු 31 සහ අප්‍රේල් 1 පාන්දර කොළඹ අසළ පිහිටි ජනාධිපති ගේ පුද්ගලික නිවාසය ඉදිරිපිට රැස් වූ ජනතාවට පොලීසියෙන් සහ හමුදාවෙන් කඳුලු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කෙරිණ. ජනමාධ්‍යවේදීන් ඇතුලු විරෝධතාකරුවන් 54ක් පමණ පොලීසියෙන් අත් අඩංගුවට ගෙන රඳවා ගත් අතර ඔවුන්ගෙන් සමහරෙකුට පොලීසියෙන් වද හිංසා

[9] 9 https://www.inform.lk/repression-of-dissent-december-2022/

පමුණුවන ලදැයි වාර්තා විය. ඊට පසුව ආණ්ඩු විරෝධී පිරිස් කොළඹ ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරි පිට ගාලුමුවදොර පිටිය අත්පත් කර ගෙන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට ඉල්ලා අස්වීමට බල කරමින් එම ස්ථානය ගෝටාගෝගම වශයෙන් නම් කරන ලදී. මැයි 9 වැනි දා අගමැති මහින්ද රාජපක්ෂ සහභාගි වූ රැස්වීමකින් පසුව ආණ්ඩුවට පක්ෂපාතී මැර කණ්ඩායමක් ගෝටාගෝගමට ප්‍රහාරයක් එල්ල කළහ. ප්‍රහාරයෙන් කුපිත වූ විරෝධතා දැක් වූ පිරිස් සහ රටේ වෙනත් ප්‍රදේශවල ජනතාව ආණ්ඩුවේ දේශපාලකයන් සතු නිවාස සහ දේපොළවලට ප්‍රහාර එල්ල කළහ. එහි දී පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙකු ඇතුළත් 10ක් මිය ගියහ. එදින සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් දේශපාලකයන් කීප දෙනෙකු ඇතුළත් 1500ක් පමණ අත් අඩංගුවට ගෙන ඇත. ඒ සමගම මහින්ද රාජපක්ෂ තනතුරෙන් ඉල්ලා අසු වූ අතර නව අගමැති වශයෙන් රනිල් වික්‍රමසිංහ පත් කෙරිණ. ජුලි 9 වැනි දා විරෝධතාකරුවෝ ජනාධිපති ලේකම් කාර්යාලයට, ජනාධිපති සහ අගමැති ගේ නිල නිවාස ඇතුළත් ආණ්ඩුවේ වැදගත් ගොඩනැගිලි කිපයකට කඩා වැදී ඒවා අත්පත් කර ගත්හ. එමනිසා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ රටින් පලා ගියේය. ඉන් පසුව අගමැති රනිල් වික්‍රමසිංහ ජනාධිපති තනතුරට පත් විය. නව ආණ්ඩුව පත්වීමෙන් පසුව ආණ්ඩු විරෝධී පිරිස් 3000කට අධික සංඛ්‍යාවක් අත් අඩංගුවට ගනු ලැබිණ.

ශ්‍රී ලංකාවේ පළමු වරට අභිමානි පෙළපාලි ජුනි 11 උතුරු පළාතේ යාපනයේ ද, ජුනි 25 ශ්‍රී ලංකාවේ අගනුවර කොළඹ ද පවත්වන ලදී. කොළඹ අභිමානි පෙළපාලිය ගෝටාගෝගම විරෝධතාවල කොටසක් වශයෙන් LGBTIQ+ ක්‍රියාකාරීන් විසින් සංවිධානය කරන ලදී. සිවිල් යුද සමයේ ජීවිතය අහිමිවූවන් සිහිපත් කිරීමට යුක්තිය සහ ජාතික ප්‍රශ්නයට දීර්ඝකාලීන දේශපාලන විසඳුමක් ඉල්ලා සිටිමින් උතුරු සහ නැගෙනහිර පළාත්වල ක්‍රියාකාරීන්, අතුරුදහන් වූවන්ගේ ඥාතීන් සහ දේශපාලන පක්ෂ නොයෙකුත් විරෝධතා සංවිධානය කළහ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වසර ගණනාවක් අත් අඩංගුවට ගෙන ඇති රැඳවියන් තමන් නිදහස් කරන ලෙස ඉල්ලා උපවාසයක් ආරම්භ කළ අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කරන මෙන් ඉල්ලා දිවයින පුරා අත්සන් එකතු කිරීමේ ව්‍යාපාරයක් පැවැත්වින.

# 3. නඩු යාවත්කාලීන කිරීම

## 2022 ජනවාරි

නෙදර්ලන්තයේ පැවති කොවිඩ් 19 සීමා කිරීම් හේතුවෙන් හේග් හි මහජන විනිශ්චය සභාවේදී කර්තෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන් පැවැත්වීමට නියමිතව තිබූ නඩු විභාගය 2022 මැයි මාසයට කල් තැබිණි. ජනමාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ ඇතුළත් මූලික මානව අයිතිවාසිකම් කඩ කිරීම් පිළිබඳව විමර්ශන කටයුතු මෙහෙය වූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂක ෂානි අබේසේකර බොරු සාක්ෂි ගොතන ලද්දේයැයි නඩු විභාගයකට මුහුණ දී සිටින අතර ඔහු තමාට එරෙහි නිර්දේශ ඇතුළත් දේශපාලන වින්දිතයන් පිළිබඳ ජනාධිපති කොමිසමේ වාර්තාව ජනාධිපතිට ඉදිරිපත් කිරීම වැළැක්වීමට සර්ටියොරාරි ආඥාවක් නිකුත්කරන ලෙස පෙත්සමක් ගොණු කෙළේය.[10] මාස දහ අටක් තිස්සේ රඳවා ගෙන සිටි කවියෙකු වූ අහ්නාෆ් ජසීම් ඇප කොන්දේසි සම්පූර්ණ කිරීමෙන් පසුව ද වැඩිපුර දිනයක් රඳවා ගැනීම නිසා රිමාන්ඩ් නිලධාරියාට එරෙහිව නඩුවක් ගොණු කෙළේය.

## 2022 පෙබරවාරි

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ 2021 අගෝස්තු මාසයේ සිට මාස 6ක් අත් අඩංගුවේ රඳවා ගත් මාධ්‍යවේදී කීර්ති රත්නායක ඇප මත නිදහස් කරන ලදී. හමුදාවේ හිටපු බුද්ධි නිලධාරියෙකු වූ රත්නායක ලන්ඩනයේ සිට පළ කරන ශ්‍රී ලංකා වෙබ් අඩවියක් වන ලංකා ඊ නිවුස් වෙබ් පිටුවට නිතිපතා ලිපි සපයන නිදහස් මාධ්‍යවේදියෙකි. 2010 දී හමුදාව විසින් පැහැර ගොස් මරා දමන ලදැයි සැලකෙන අතුරුදහන් වූ ජනමාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ නඩු විභාගය 2022 අප්‍රේල් 29 දක්වා කල් තැබිණ. මානව අයිතිවාසිකම් නීතිඥ හිජාස් හිස්බුල්ලා මාස 20 ක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවුම් බාරයේ තබා ගෙන ඇප මත නිදහස් කරන ලදී. ජවිපෙ නායකයාට බිත්තරවලින් පහර දුන් සැකකරුවන් පොලිස් අත් අඩංගුවේ දී අතුරුදහන්ව ඇතැයි වාර්තා වේ. 2021 දෙසැම්බර් මස තමා විසින් කරන ලද පැමිණිල්ලක් ගැන කිසිදු විමර්ශනයක් නොපැවැත්වෙන අතර තමාට එල්ල වන තර්ජන ගැන දෙවන වරටත් පැමිණිල්ලක් මාධ්‍ය අයිතිවාසිකම් ක්‍රියාරිකයෙකු සහ ජොෂ්ඨ මාධ්‍ය වේදියෙකු වන ලසන්ත රුහුණගේ ඉදිරිපත් කෙළේය.

## 2022 මාර්තු

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දින 470ක් රඳවා සිටි මඩකලපුවේ මුරුගුපිල්ලේ කොකිලාන් තාසන්, ප්‍රදේශයේ ගෝකුලන් නමින් ද හැඳින්වෙන ඡායාරූප මාධ්‍යවේදීයෙකු ඇප මත නිදහස් කරන ලදී. ඔහු අත් අඩංගුවට ගෙන ඇත්තේ එල් ටී ටී ඊ ඡායාරූප පල කරයේයි යන චෝදනාව මතය. එහෙත් එම ඡායාරූප උතුර සහ නැගෙනහිර යුද්ධයේ වින්දිතයන් සිහිපත් කිරීම සඳහා පැවැත් වූ අනුස්මරණයක ඡායාරූපයැයි පැවසේ. ඉස්ලාම් විරෝධී කණ්ඩායම්වල චෝදනා මත බලහත්කාරයෙන් වන්ධ්‍ය සැත්කම් කරන ලදැයි අත් අඩංගුවට ගෙන සිටි වෛද්‍ය ෂාෆි ෂිහාබ්දීන් 2021 දෙසැම්බර් මස නිදොස් කොට නිදහස් කර සේවයේ නැවත පිහිටුවන ලදී. එහෙත් ඔහුට තම හිඟ

[10] https://www.dailymirror.lk/latest_news/Shani-files-writ-petition-against-Presidential-Commission/342-229538

වැටුප් ලබා ගැනීමට අභියාචනාධිකරණයේ නඩුවක් ගොණු කිරීමට සිදු විය. අභියාචනාධිකරණය ඔහුගේ හිඟ වැටුප් ගෙවීමට පියවර ගන්නා ලෙස නීතිපතිවරයාට නියෝග කෙළේය. විපක්ෂයේ දේශපාලන රැස්වීමකදි වෙඩි තබා පුද්ගලයෙකු මරා දැමීම පිළිබඳව දඩුවම් නියමව සිටි පාර්ලිමේන්තු මංත්‍රී ප්‍රේමලාල් ජයසේකර සහ තවත් දෙදෙනෙකු අභියාචනාවකින් නිදහස් කෙරිණ. 2015 ජනවාරි මස ඔහුගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් විපක්ෂයේ මැතිවරණ රැස්වීමක වේදිකාවක් ඉදි කරමින් සිටි 200ක පමණ පිරිසකට වෙඩි තබා පුද්ගලයෙකු මරණයට පත් කර තවත් පිරිසකට තුවාල සිදු කෙළේයැයි චෝදනා ඉදිරිපත් කර තිබිණ.

## 2022 අප්‍රේල්

පුත්තලමේ මහාධිකරණය නීතිඥ හිජාස් හිස්බුල්ලා ට එරෙහි නඩුවේ චූදිතයන් තිදෙනෙකුට ඇප ලබා දුන්නේය. එම චූදිතයන් අත් අඩංගුවට ගෙන ඇත්තේ තමා පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයට සම්බන්ධයැයි බොරු සාක්ෂි දීම නිසායැයි හිස්බුල්ලා ට්විටර් පණිවුඩයක සඳහන් කෙළේය. 2021 මැයි මස මඩකලපුවේ අනුස්මරණ උත්සවයක් පැවැත් වූයේයැයි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගෙන සිටි රඳවා සිටි හත් දෙනෙකු මාස හතකට පසුව නිදොස් කොට නිදහස් කරන ලදී.



ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට නෙ මාස හතකට වැඩි කාලයක් රඳවා ගෙන සිටි යුද්ධයේ වින්දිතයන් සිහිපත් කිරීමේ අනුස්මරණ උත්සවය. ඡායාරූප අනුග්‍රහය තමිල් ගාර්ඩියන්

## 2022 මැයි

මැයි 12 සහ 13 ඝාතනය කරන ලද ජනමාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග නඩුව හේග් හිදී ඝාතනය කරන ලද ජනමාධ්‍ය වේදීන් සඳහා වූ ස්ථිර ජනතා විනිශ්චය සභාව ඉදිරියේ විභාගයට ගන්නා ලදී. ගලගොඩඅත්තේ ඥානසාර හිමිට සමාව දීමට හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන ගත් තීරණය අභියෝගයට ලක් කරමින් ගොණු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකක් තවදුරටත් පූර්ව විභාග කරුණු දැක්වීමට මැයි 17 දින නියමිත ය. වෙනත් නඩුවක දී ශ්‍රේෂ්ඨාධිකරණය 2021 ජූනි මාසයේ දී ලබා දුන් ජනාධිපති සමාවට එරෙහිව අන්තර්වාර තීරණයක් නිකුත් කරමින් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති දුමින්ද සිල්වා අත් අඩංගුවට ගැනීමට නියෝග කෙළේය. ඔහු 2011 දී විපක්ෂයේ දේශපාලකයෙකු සහ ඔහුගේ ආධාරකරුවන් තිදෙනෙකු මරා දැමීම සම්බන්ධයෙන් වැරදිකරු බව කලින් තීරණය කර තිබිණ. 2022 මැයි 30 වැනි දා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිසම හිටපු ඇමති ජොන්ස්ටන් ප්‍රනාන්දු 2015 මැතිවරණයේ දී ඡන්ද වැඩට රජයේ සේවකයන් යොදා ගත්තේයැයි අලුතින් චෝදනා ගොණු කළේය. එම චෝදනාව සම්බන්ධයෙන් කොමිසම කලින් පැවරූ නඩුවක් 2022 ජනවාරි මස තාක්ෂණික කරුණක් මත ඉල්ලා අස්කර ගත්තේය.

## 2022 ජූනි

ජනමාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදහන් කිරීමේ නඩු විභාගය ස්ථිර මහාධිකරණ විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ විභාගයට ගත් විට පැමිණිල්ලේ ප්‍රධාන සාක්ෂිකරුවෙකු තමා වසර හතරකට පෙර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ලබා දුන් සාක්ෂිය පොලිස් නිලධාරීන්ගේ බලපෑම මත ලබා දුන්නේයැයි ඉල්ලා අස්කර ගත්තේය. ඔහු මීට පෙර ප්‍රගීත් එක්නැලිගොඩ දැන සිටියේ නැතැයි ද පැවසුවේය. සබරගමුව පළාත් සභාවේ හිටපු මංත්‍රී රංජිත් නන්දසේන 1999 දී මරා දැමීම සම්බන්ධයෙන් පවරා තිබූ නඩුවකින් සබරගමුව පළාත් සභාවේ හිටපු මංත්‍රී හසිත සමන්ත නිදොස් කොට නිදහස් කරන ලදී. හිටපු පාර්ලිමේන්තු මංත්‍රී රංජන් රාමනායකට විභාග වෙමින් පවතින නඩුවක විනිශ්චය කලින්ම තීරණය කර ඇතැයි රූපවාහිනී සාකච්ඡාවක දී පැවසුවේයේයැයි වසර දෙකක අත් හිටුවන ලද බරපතළ වැඩ සහිත සිර දඬුවමක් නියම කෙරිණ. හිටපු පාර්ලිමේන්තු මංත්‍රී භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මරණයට පත් කිරීමට අදාලව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පසුගිය මස නිකුත් කළ අන්තර්වාර නියෝගය අනුව හිටපු පාර්ලිමේන්තු මංත්‍රී සහ නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති දුමින්ද සිල්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අත් අඩංගුවට ගෙන බන්ධනාගාර නිලධාරීන්ට භාරදෙන ලදී.

මැයි 9 ගෝටාගෝගම විරෝධතාකරුවන්ට ප්‍රහාරයක් එල්ල කිරීම සම්බන්ධයෙන් සිදුවෙමින් පවතින විමර්ශන කටයුතුවලට කිසියම් බලපෑමක් කිරීම වැළැක්වීම සඳහා බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මාරු කිරීමට නීතිපතිට කලින් ලබා දුන් නියෝගය ක්‍රියාත්මක නොකෙළේ ඇයිදැයි මහෙස්ත්‍රාත්වරයා පොලීසියෙන් විමසුවේය. සිද්ධිය වූ ස්ථානයේ සිටි ජ්‍යෙෂ්ඨතම පොලිස් නිලධාරියා තෙන්නකෝන් වන අතර ඔහු ප්‍රහාරය වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීමට අපොහොසත් වූයේය. පාර්ලිමේන්තු මංත්‍රීන් දෙදෙනෙකු ඇතුළත් දේශපාලකයන් පස් දෙනෙකු ප්‍රහාරය සම්බන්ධයෙන් අත් අඩංගුවට ගෙන පසුව ඇප මත නිදහස් කරන ලදී. නිති

බලාත්මක කරන නිලධාරීන් විසින් පැහැර ගෙන යන ලද්දේයැයි සැලකෙන ක්‍රියාකාරිකයෙකු වන අනුරුද්ධ බණ්ඩාරට එරෙහිව පවරා තිබූ නඩුවෙන් නිදහස් කරන ලදී.

## 2022 ජූලි

විරෝධතාකරුවන්ට පහරදීම වැළැක්වීමට නිසි නියෝග නිකුත් කිරීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් එහි සිටි වඩාත්ම ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරි තෙන්නකෝන් පිළිබඳව පැවැත්වෙන විමර්ශන කටයුතුවල උද්ධෘත නීතිපති දෙපාර්තමේන්තුවට ලබා දී ඇතැයි පොලීසිය අධිකරණයට දැන් වූයේය.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා සහ තවත් පුද්ගලයන් කීප දෙනෙකු උසස් දේශපාලකයන් සහ ඉහළ නිලධාරීන් ඇතුළත් 13 දෙනෙකුට එරෙහිව ආර්ථික අර්බුදයට ඔවුන්ගේ ඇති වගකීම පිළිබඳව මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකක් ගොණු කරන ලදී. ජනාධිපති රාජපක්ෂ රටින් පලා ගිය පසු අනෙකුත් අය ද රටින් පලා යෑම වැලැක්වීමට නියෝග නිකුත් කරන්නැයි පෙත්සම්කරුවෝ ඉල්ලා සිටියහ. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය හිටපු මුදල් ඇමති මහින්ද රාජපක්ෂ සහ බැසිල් රාජපක්ෂ, හිටපු මහබැංකු අධිපතී අජිත් නිවාඩ් කබ්රාල් සහ මහාචාර්ය ඩබ්ලිව් ඩී ලක්ෂ්මන් සහ වෙනත් ජ්‍යෙෂ්ඨ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ට එරෙහිව සංචාරක තහනමක් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නිකුත් කරන ලදී.

## 2022 අගෝස්තු

අගෝස්තු 9 වැනි දා ශ්‍රී ලාකවේ නීතිඥ සංගමය නිසි ක්‍රියා පටිපාටිය අනුගමනය නොකර 'පැහැර ගැනීමට සමාන ආකාරයෙන් අත් අඩංගුවට ගැනීම් සහ රඳවා ගැනීම් සිදු කරන්නේයැයි පොලිස්පතිට ලිපියකින් දැනුම් දුන්නේය. පැහැර ගැනීමට සමාන ආකාරයෙන් අත් අඩංගුවට ගත් නිදහස් ජනමාධ්‍යවේදියෙකු මෙන්ම ශිෂ්‍ය ක්‍රියාකාරිකයෙකු වන වෙරංග පුෂ්පික අගෝස්තු 9 වැනි දින කඩුවෙල මහෙස්ත්‍රාත් ඇප මත නිදහස් කෙළේය. රජයේ රූපවාහිනී ආයතනයේ විකාශනයට බාධා කළ විරෝධතාකරුවෙකු වන ධනීෂ් අලි ඇප මත නිදහස් කෙරිණ. රඹුක්කන දී විරෝධතාකරුවන්ට වෙඩි තැබූ පොලිස් නිලධාරීන් හතර දෙනා ඇප මත නිදහස් කෙරිණ. 2022 අප්‍රේල් 19 ඉන්ධන හිඟකම සහ ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව විරෝධතාවය දැක් වූ පිරිසකට පොලීසියෙන් වෙඩි තැබීමෙන් එක විරෝධතාකරුවෙකු සහ තවත් 24කට තුවාල සිදු විය. ආණ්ඩුවට එරෙහිව විරෝධතා දැක් වූ පූජකවරියක් අත් අඩංගුවට ගෙන ඇප ලබා දුන්නේය. විනිශ්චයකරුවන් දූෂිතයැයි පැවසීමෙන් අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් සිරගත කර සිටි හිටපු ඇමති සහ පාර්ලිමේන්තු මංත්‍රී රන්ජන් රාමනායක ජනාධිපති සමාව යටතේ නිදහස කෙරිණ. මානව හිමිකම් කොමිසම සිරස රූපවාහිනි ජනමාධ්‍යවේදීන්ට විශේෂ කාර්ය සාධක බලකායේ ( STF) පොලිස් නිලධාරීන් විසින් පහර දීම පිළිබඳව පැවැත් වූ පරීක්ෂණය ගැන පුවත් පත් නිවේදනයක් නිකුත් කෙළේය. එහි නිර්දේශ දෙකකි. (1) තත්වය පිළිබඳව වගකීම භාරව සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා විමර්ශන කටයුතු අවසන් වන තෙක් කොළඹින් බැහැර ප්‍රදේශයකට මාරු කර යැවීම. (2) සිවිල් මෙහෙයුම් කටයුතුවලදී පොලිසිය කැළැ ඇඳුම් ඇඳීම නොකළ යුතුය. අගෝස්තු 22 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විරෝධතාකරුවන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගැනීම ගැන පොලිස්පතිට ලිපියක් යැව්වේය. විරෝධතාකරුවන් අත් අඩංගුවට ගැනීම හේතු යුක්ති කිරීමට

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හිතුවක්කාර ලෙසත් ප්‍රජාතන්ත්‍රවාදී නොවන ආකාරයෙන් යොදා ඇති බව එම ලිපියේ සඳහන් කර තිබිණ. එහි නිර්දේශවලට (1) නීතිය බලාත්මක කරන ආයතනවල වැරදිකරුවන් හඳුනා ගැනීමට සහ සුදුසු නීති පියවර නිර්දේශ කිරීමට කොමිටියක් පත් කිරීම, (2) සිද්ධිය වන අවස්ථාවේ ආරක්ෂක ලේකම් සහ පොලිස්පති සහ ඔහුගේ යටත් නිලධාරීන් අතර පැවති දුරකතන සංවාද පරීක්ෂා කිරීම.

## 2022 සැප්තැම්බර්

සැප්තැම්බර් 19 වැනි දා ජනමාධ්‍යවේදීන් ඝාතනය කිරීම පිළිබඳ ජනතා විනිශ්චය සභාව ජනමාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය ශ්‍රී ලංකාණ්ඩුව විශේෂයෙන්ම ජීවිතයට ඇති අයිතිය, ප්‍රකාශ කිරීමේ අයිතිය සහ ඵලදායි ප්‍රතිකර්ම ලබා ගැනීමේ අයිතිය ඇතුළත් අන්තර්ජාතික මානව අයිතිවාසිකම බරපතළ ලෙස උල්ලංඝනය කර ඇතැයි තීරණය කෙළේය. විරෝධතාවයක දී අධිකරණ නියෝගයක් කඩ කිරීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගෙන සිටි උසස් ජාතික ඩිප්ලෝමා ශිෂ්‍ය සංගමයේ කැඳවුම්කරු සැප්තැම්බර් 16 වන තෙක් රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණ. රාජපක්ෂ පවුලේ සාමාජික සහ හිටපු මුදල් ඇමති බැසිල් රාජපක්ෂට මාසයක කාලයක් වෛද්‍ය ප්‍රතිකාර සඳහා එක්සත් ජනපදයට යෑමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අවසර ලැබිණ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂක ෂානි අබේසේකර සමග අත් අඩංගුවට ගත් පොලිස් පරීක්ෂක සුගත් මෙන්ඩිස් ට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියම කළ ආකාරයට වැටුප් ගෙවා නැතැයි ඔහු මෝසමක් මගින් අධිකරණයට දැනුම් දුන්නේය. අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් ගොණු කර ඇති පෙත්සම් දෙකකට අදාලව පාර්ලිමේන්තු මංත්‍රී සනත් නිශාන්තට 2022 ඔක්තෝබර් 13 අධිකරණයේ පෙනී සිටීමට අභියාචනාධිකරණයෙන් දැනුම් දෙන ලදී. සැප්තැම්බර් 9 වැනි දින විරෝධතාකරුවන්ට සහාය දැක්වීමට තම වාහනයේ නළාව හැඬ වූ නීතිඥ දුෂ්මන්ත වීරරත්න එම නඩුවෙන් නිදහස් කෙරිණ.

## 2022 ඔක්තෝබර්

ආරක්ෂක අමාත්‍යංශය සැප්තැම්බර් මස රාජ්‍ය රහස් පනත යටතේ අධි ආරක්ෂක කලාප වෙන් කරමින් නිකුත්කළ ගැසට් නිවේදනය අවලංගු කෙළේය. මානව අයිතිවාසිකම් නීතිඥ හිජාස් හිස්බුල්ලාට එරෙහි නඩු විභාගයේ දි අභිචෝදක තුන්වැනි වතාවටත් පුත්තලම මහාධිකරණයේ පෙනී සිටියේ නැත. කලින් නිකුත් කරන ලද සිතාසියක් අනුව රාජ්‍ය ඇමති සනත් නිශාන්ත අධිකරණයට අපහාස කිරීමේ චෝදනාවක් මත නිකුත් කළ සිතාසියකට අධිකරණයට ඉදිරිපත් නොවීම නිසා අත් අඩංගුවට ගෙන  ඉදිරිපත් කිරීමට අභියාචනාධිකරණය වරෙන්තුවක් නිකුත් කෙළේය. එදිනම ඔහු අධිකරණයට ඉදිරිපත් වූ අතර දැඩි ලෙස අවවාද කිරීමෙන් පසුව නිදහස් කෙරිණ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දින 90ක රැඳවුම් නියෝගයක් මත රඳවා සිටි ශිෂ්‍ය ක්‍රියාකාරික හෂාන් ගුණතිලක ඔහුට එරෙහිව නඩුව පවත්වා ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැති බව පොලීසියෙන් දැනුම්දීම නිසා තංගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ඔහු නිදහස් කරන ලදී. ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය සම්බන්ධයෙන් ඉහළ දේශපාලකයන්ගේ සහ නිලධාරීන් කණ්ඩායමකගේ වගවීම පිළිබඳව ඉදිරිපත් කර ඇති පෙත්සම පවත්වා ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අවසර ලැබිණ. මූල්‍ය අවභාවිතය සම්බන්ධයෙන් ගොණු කර ඇති නඩුවක් සම්බන්ධයෙන් හිටපු මහබැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් පනවා ඇති විදේශ ගමන් සංචාර තහනම නොවැම්බර් 24 දක්වා දීර්ඝ කෙරිණ.

ක්‍රියාකාරිකයන්වන ලලිත් වීරරාජ් සහ කුගන් මුරුගානන්දන් 2011 දී යාපනයේ දී අතුරුදහන් කිරීම පිළිබඳව පවරා ඇති නඩුවේ සාක්ෂි දීමට අදාලව හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට නිකුත් කර ඇති සිතාසිය නැවත නිකුත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කෙළේය. වයස අවුරුදු 14ක ගැහැනු ළමයෙකුට ලිංගික අතවර කිරීම සම්බන්ධයෙන් අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති සරුව ලියනගේ සුනිල් නිදොස් කොට නිදහස් කරන ලදී. රජය සතු ලක්සතොස ආයතනයේ අල්ලස් ලබා ගැනීම සම්බන්ධයෙන් හිටපු ඇමති ජොන්ස්ටන් ප්‍රනාන්දු සහ තවත් දෙදෙනෙකුට අධිචෝදනා පත්‍ර භාර දෙන ලදී.

## 2022 නොවැම්බර්

අතුරුදහන් ජනමාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩගේ බිරිඳ සන්ධ්‍යා එක්නැලිගොඩ කලින් අවස්ථා දෙකක දී ප්‍රගීත් එක්නැලිගොඩ ගේ අතුරුදහන්වීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති හබෙයාස් කෝර්පුස් ආඥාව සම්බන්ධයෙන් වූ විභාගයට සහභාගිවීමට අධිකරණ බලධාරීන් ඉඩ නොදුන්නේයැයි ශ්‍රේෂ්ඨාධිකරණයට ලිපියකින් දැනුම් දුන්නාය. ඉදිරිපත් කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සමක් සලකා බැලූ ශ්‍රේෂ්ඨාධිකරණය අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ මහෙස්ත්‍රාත්වරයෙකු සහ අධිකරණ වෛද්‍ය නිලධාරියෙකුට ඉදිරිපත් කරන්නැයි පොලිසියට නියෝග කෙළේය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් ආයතනය ත්‍රස්ත චෝදනා යටතේ රඳවා සිටින මුදලිගේ සහ සිරිධම්ම හිමිට එරෙහි ත්‍රස්ත චෝදනා ඉවත් කරන මෙන් ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේය. නීතිපතිගේ උපදෙස් ලැබෙන තෙක් ඔවුන් දෙදෙනා රක්ෂිත බන්ධනාගාරගත කරන මෙන් කොළඹ මහෙස්ත්‍රාත් නියෝග කෙළේය. ගල්වැව සිරිදම්ම හිමි ඇප මත නිදහස් කොට වෙනත් චෝදනා යටතේ අත් අඩංගුවට ගන්නා ලදී. විරෝධතාකරුවන් විසින් ජනාධිපති මන්දිරයේ තිබී සොයා ගත් රු. දශලක්ෂ 18ක මුදල ගැන හිටපු ජනාධිපතිගෙන් ප්‍රකාශයක් සටහන් කර ගන්නා මෙන් කොටුව මහෙස්ත්‍රාත් නියෝගයක් නිකුත් කෙළේය.

## 2022 දෙසැම්බර්

තමන් විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගමක කරන ලද අධ්‍යයනයකින් ළමා මන්දපෝෂණය වැඩි වෙමින් පවතින බව මාධ්‍යයට කළ ප්‍රකාශය සම්බන්ධයෙන් පසුගිය මස සිට වැඩ තහනමට ලක් කර සිටින වෛද්‍ය චමල් සන්ජීව ඉදිරිපත් කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම පවත්වා ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අවසරය ලැබිණ. අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ සහ අන්තර්විශ්ව විද්‍යාල භික්ෂු බලමණ්ඩලයේ කැඳවුම්කරු ගල්වැව සිරිදම්ම හිමි හඳුනා ගැනීමේ පෙරෙට්ටුවක දී පොලීසියට හඳුනා ගැනීමට නොහැකිවීම නිසා 2022 දෙසැම්බර් 06 කඩුවෙල මහෙස්ත්‍රාත් නිදහස් කෙළේය. එහෙත් වෙනත් නඩුවක් සම්බන්ධයෙන් මුදලිගේ තව දුරටත් අත් අඩංගුවේ රඳවා ගන්නා ලදී. ක්‍රියාකාරිකයන් කණ්ඩායමක් මුදලිගේ ගාල්ලේ කුප්‍රකට බූස්ස බන්ධනාගාරයට මාරු කර නොයවන්නැයි බන්ධනාගාර කොමසාරිස් හමුවී ඉල්ලීමක් කළහ. කලින් අවස්ථාවක ප්‍රදේශයේ පැවති විරෝධතාවයක් ආවරණය කිරීමේ දී හමුදාවෙන් සහ පොලීසියෙන් තමාට කරන ලද හිරිහැර සම්බන්ධයෙන් කළ පැමිණිල්ලක් අනුව ප්‍රකාශයක් සටහන් කර ගැනීමට මුලතිවු හි ජනමාධ්‍යවේදී කනපතිපිල්ලේ කුමනන් මුලතිවු පොලිසියට කැඳවා ඇත. අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරියෙන් කලින් උපදෙස් දී ඇති ආකාරයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂක ෂානි අබේසේකරට පොලිස්

ආරක්ෂාව ලබා දෙන බවට නීතිපති සහතික වූයේය. බස්නාහිර පළාත භාර නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් පලිගැනීමක් වශයෙන් හිතා මතාම තමාට ආරක්ෂාව ලබා දිම මගහැර ඇතැයි ඔහු ප්‍රකාශ කෙළේය. අරගල විරෝධතා ව්‍යාපාරයට සම්බන්ධ සැකකරුවන්ට ඇප ලබා දීමේ දි ඇප ලබා දීම සම්බන්ධයෙන් පුවත් පත් සාකච්ඡාවක දී මහෙස්ත්‍රාත්වරුන් විවේචනය කිරීම නිසා අමාත්‍ය සනත් නිසාන්තට එරෙහිව අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව යටතේ නඩුවක් කෙටුම්පත් කිරීමට අභියාචනාධිකරණයෙන් නිතිපතිට නියෝග කෙළේය.

# 4. මාධ්‍ය සහ ප්‍රකාශ කිරීමේ නිදහස මර්දනය කිරීම

## 2022 ජනවාරි

සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෙකු සහ නලුවෙකු වන සුදත්ත තිලකසිරි ආණ්ඩුවට අපහාස වන ආකාරයේ සමාජ මාධ්‍ය තොරතුරු පළ කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට කැඳෙව්වේය. ජනාධිපතිට අපහාස කිරීම දඬුවම් දිය හැකි වරදක්යැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශක කීවේය. යාපනය මාන්කුලම් හි මහෙස්ත්‍රාත් උසාවියේ නාම පුවරුවේ ඡයාරූපයක් ගැනීම නිසා ජනමාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන්ට හිරිහැර කෙරිණ. ලංකාදීප ජනමාධ්‍යවේදී චාන්දනී දිසානායකට කුරුණෑගල නගර සභාවෙන් පවත්වන සති පොළ වාර්තා කිරීමේ දී එහි ඡායාරූපයක් ගැනීමට නගර සභාවෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුබව දක්වා ඇත. හිටපු ආරක්ෂක ලේකම් පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙක් කොළඹ මහාධිකරණ විනිශ්චය සභාව ඉදිරියට පැමැණි විට ජනමාධ්‍යවේදීන්ට උසාවි භූමියට පැමිනීමට ඉඩ දුන්නේ නැත. අධ්‍යාපන ආයතනයකින් කරන ලද පැමිණිල්ලක් අනුව යූ ටියුබ් නාලිකාවක තොරතුරු ඉවත් කිරිමට නියෝගයක් නිකුත් කෙරිණ. .



## 2022 පෙබරවාරි

සිරිල් ගාමිණී පියතුමා මුහුණු පොතේ තබන ලද සටහනකට ප්‍රතිචාර සිය මුහුණු පොතේ පළ කිරීම නිසා සාමාන්‍ය පුරවැසියෙකු වන කුමාර ජෝසප් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවන ලදී. එම ප්‍රතිචාරයේ අපහාසාත්මක කිසිත් සඳහන් නොවුවද ඔහුගෙන් පැය 5ක් ප්‍රශ්න කරන ලදී. සිවිල් ඇඳුමෙන් යුත් හමුදා නිලධාරීන් කලින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගෙන

ඇප මත නිදහස් කර ඇති කවියෙකු වන අහ්නාෆ් ජසීම් ගේ නිවසට ගොස් ඇත. මඩකලපුවේ ජනමාධ්‍යවේදියෙකු වන පුන්‍යමූර්ති සසිකරන් ට නිදහස් දින පැවැත්වෙන විරෝධතාවයක් වාර්තා කිරීම තහනම් කිරීමේ නියෝගයක් අධිකරණයෙන් නිකුත් කර ඇත. ඔහු එවැනි විරෝධතාවයක් ගැන අසා සිටියේ හෝ නැත. මඩකලපුවේ ජනමාධ්‍යවේදියෙකු සහ මාධ්‍ය ක්‍රියාකාරිකයෙකු වන සෙල්වකුමාර් නිලන්තන් ශ්‍රී ලංකා පොලීසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්න කර ඇත. ජනමාධ්‍යවේදී චමුදිත සමරවික්‍රම ගේ නිවසට ගල් සහ අශූචි ප්‍රහාරයක් එල්ල කර ඇත. **IBC** දෙමළ මාධ්‍ය වෙබ් අඩවියේ ජනමාධ්‍ය වේදියෙකු වන ලක්ෂ්මන් දේවපතීරන්ට රාජ්‍ය ඇමති කෙනෙකුගේ දේශපාලන ආධාරකරුවන් පිරිසක් පහර දුන්හ.

## 2022 මාර්තු

අරුණ දිනපතා සහ සති අන්ත පුවත් කතෘ චමින්ද සේනාරත්නට ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සතුව ඇතැයි කියන නීති විරෝධී වත්කම් ගැන තොරතුරු පළ කිරීම නිසා දුරකතනයෙන් මරණ තර්ජන එල්ල වූ බව වාර්තාවේ. තම මුහුණු පොතෙන් ආණ්ඩුව විවේචනය කරන සටහනක් තැබීම නිසා රජය සතු රූපවාහිනී සංස්ථාවේ නිදහස් ජනමාධ්‍ය වේදී පාරමි නිලෙප්ති රණසිංහ රැකියාවෙන් ඉවත් කර ඇත. ස්වර්ණවාහිනි ජනමාධ්‍ය වේදියෙකු වන රාහුල් සමන්ත හෙට්ටිආරච්චිට නීති විරෝධී ව්‍යාපාරයක් පිළිබඳ සේයා පටියක් නිකුත් නොකරන ලෙස දේශපාලකයෙකු සහ ඔහුගේ මාධ්‍ය ආයතනයක් හිමි සොහොයුරෙකු තර්ජනය කළහ. වවුනියාවේ මාර්ග අනතුරක් වාර්තා කිරීමේ දී ජනමාධ්‍ය වේදියෙකු වන රාසයියා ජයසංකර්ට පහර දීමේ සිද්ධියක් වාර්තා වේ. ජනාධිපති ඔහුගේ මුහුණු පොතේ සටහන් තැබීම සීමා කෙළේය. විපක්ෂයේ තරුණ අංශයේ නායකයෙකු වන කණිෂ්ක ඩි ලැනරෝල් ගාහස්ථ ගෑස් සිලින්ඩර් පෝලිමක ඇති වූ උණුසුම් තත්වයක් මුහුණු පොතෙන් සජීවීව ප්‍රචාරය කිරීම පොලීසියෙන් වළක්වන ලදී.

## 2022 අප්‍රේල්

මාර්තු 31 වැනි දා ජනාධිපතිගේ පුද්ගලික නිවස ඉදිරිපිට පැවති විරෝධතාවයක් වාර්තා කරමින් සිටි ජනමාධ්‍යවේදීන් 6ක් අත් අඩංගුවට ගෙන තවත් ජනමාධ්‍යවේදීන් 9කට සහ විරෝධතාකරුවන් සිය ගණනකට පොලිසියෙන් සහ හමුදාවෙන් පහර දී ඇත. එම සිද්ධිය සම්බන්ධයෙන්ම ඩේලි මිරර් පුවත් පතේ ඡයාරූප ශිල්පී වරුණ වන්නිආරච්චි ගෙන් පැය 4කට අධික කාලයක් ප්‍රශ්න කෙරිණ. විරෝධතා පැවති සමයේ සිදු වූ හානි පිළිබඳව වාර්තා කළ ජනමාධ්‍ය වේදින්ට ජනාධිපති මාධ්‍ය අංශයේ අධ්‍යක්ෂකයෙකු තර්ජනය කෙළේය. පුද්ගලික රූපවාහිනී ආයතනයක් වන සිරස රූපවාහිනිය දැනුවත්ව ජනතාව අතර කෝපය ඇති කිරීමට මිරිහාන විරෝධතාවය ගැන තොරතුරු බෙදා හරින නිසා එම ආයතනය ගැන පරීක්ෂණයක් ආරම්භ කිරීමට පොලිස්පති 2022 අප්‍රේල් 1 දින අංක GP/PA/CID/OUT/76/22 යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලිපියකින් දන්වා ඇත. ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ පිළිබඳව සමාජ මාධ්‍ය යේ සටහන් තැබීම සම්බන්ධයෙන් බුද්ධි අංශයේ නිලධාරින් ජනමාධ්‍යවේදීන් වන එස් නිලකන්තන් සහ පී සසිකරන්ගේ මඩකලපුවේ නිවෙස්වලට ගොස් ඇත. දෙමළ දේශපාලන පක්ෂයක් උතුරේ දෙමළ ජාතික ජනතා පෙරමුණ සංවිධානය කළ පුවත් සාකච්ඡාවකට ජනමාධ්‍යවේදීන් සහභාගිවීම පොලීසියෙන් වළක්වන ලදී. ආරක්ෂක

අමාත්‍යාංශයේ ඉල්ලීමක් අනුව ක්‍රියාත්මක වූ විදුලි සංදේශන නියාමන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් ගේ උපදෙස් අනුව සමාජ මාධ්‍යය සීමා කළ ද මහජන උපයෝගිතා කොමිසමේ සහ මානව හිමිකම් කොමිසමේ මැදිහත්වීම නිසා එය ඉවත් කර ගන්නා ලදී.

## 2022 මැයි

2022 මැයි 4 වැනි දා පාර්ලිමේන්තු ගොඩනැගිල්ල ඉදිරිපිට පැවති විරොධතාවයක දී අත් අඩංගුවට ගත් පිරිස් අතර සංඛ්‍යාන ජනමාධ්‍ය වේදී බුවනෙක පෙරේරා ද වූයේය. 2022 මැයි 14 වැනි දා මුල්ලිවයිකාල් හි යුද්ධයේ වින්දිතයන් සිහිපත් කිරීමේ අනුස්මරණ උත්සවයක සූදානම්වීමේ කටයුතු වාර්තා කිරීමට ගිය මුලතිවු ජනමාධ්‍ය වේදී ෂන්මුගම් තවසීලන්ට ශ්‍රී ලංකාවේ හමුදාවෙන් බාධා පමුණුවා ඇත. 2022 මැයි 17 ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරු තිදෙනෙකු ස්වර්ණවාහිනී ජනමාධ්‍යවේදී ප්‍රගීත් පෙරේරා සහ සිරස ජනමාධ්‍යවේදී කසුන් සමරවීර ට පහර දි තර්ජනය කොට ඔවුන්ගේ ජංගම දුරකතන බලහත්කාරයෙන් පැහැර ගෙන ඇත. සමාජ මාධ්‍ය යේ තබන ලද සමහර සටහන්වලින් කරන ලද හෙළිදරවු නිසා 2022 මැයි 25 විලොගර් සහ යූ ටියුබ් සටහන්කරු දර්ශන හඳුන්ගොඩ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවූයේය. 2022 මැයි 05 වැනි දා අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනේ හි පාලමුනෙයි ප්‍රදේශයේ පොලිසිය සහ ගම්වැසියන් අතර හටගත් ගැටුමක් වාර්තාකරමින් සිටි ජනමාධ්‍යවේදී ෂහීර් ඛාන් පාරුක්ට කිසියම් පිරිසක් පහර දුන්හ. 2022 මැයි 21 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර් නගරයේ ඉන්ධන පිරවුම් හලක් ඉදිරිපිට රැස්වන පිරිසක් වාර්තා කිරීමට ගිය නිදහස් ජනමාධ්‍යවේදී මොහමඩ් බුහාරිට කිසියම් පිරිසක් පහර දුන්හ. රජය සතු රූපවාහිනි නාළිකාවක් වන රූපවාහිනි සංස්ථාවේ වැඩ සටහන් නිවේදිකාවක් වන වසුන්දරා ගමගේ ඇතුලු සමාජ මාධ්‍ය කණ්ඩායමක පාලකයන් තිදෙනෙකු මැයි 9 වැනි දා ගෝටාගෝහොම් ගමට ආණ්ඩුවට පක්ෂපාත මැර කණ්ඩායම් පහර දීමෙන් පසු හටගත් ප්‍රචන්ඩ ක්‍රියාවලට අදාලව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත් අඩංගුවට ගෙන ඇත. කුරුණෑගල ගෝටාගෝහොම් ගම හා සම්බන්ධ ප්‍රකට නිදහස් ජනමාධ්‍ය වේදිනියක් සහ කැපී පෙනෙන ක්‍රියාකාරිණියක් වන පුෂ්පා විරසේකර ''ගිනි තැබීමේ සිද්ධියක් සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට ඇගේ සැමියා සමග 2022 මැයි 16 වැනි දා වාරියපොල පොලිස් ස්ථානයට කැඳවා ඇත. ගාලු මුවදොර විරෝධතා භූමියට එල්ල කළ මැර ප්‍රහාරය විවේචනය කරමින් මුහුණු පොතේ සටහනක් තැබු රජයේ තරුණ සේවා නිලධාරියෙකු වන ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ හැටන් නගරයේ ආරුමුගම් බාලසුබ්‍රමනියම් අත් අඩංගුවට පත් විය. හැටන් දිස්ත්‍රික් උසාවියට ඉදිරිපත් කිරීමෙන් පසුව ඔහු ඇප මත නිදහස් කෙරිණ.

## 2022 ජුනි

ආණ්ඩුවේ ප්‍රධාන සංවිධායෙකුගේ නිවසක් ඉදිරියේ පැවති විරෝධතාවයක් ආවරණය කරමින් සිටි ඩේලි මිරර් පත්‍රයේ ජනමාධ්‍යවේදිනියක් වන ජමිලා හුසෙන්ට විරෝධතාකරුවන් විසින් වාචිකව තර්ජනය කරන ලදී. ඉන්ධන පෝලිමක පැවති තත්වයක් ආවරණය කරමින් සිටි නැගෙනහිර පළාතේ ජනමාධ්‍යවේදී ෂන්මුගම් තවසීලක්ට ප්‍රහාරයක් එල්ල කර ඇත. මුලතිවු නාවික හමුදා කඳවුරෙන් ඉඩම් අත් කර ගැනීමකට එරෙහිව 2022 ජුනි 07 පැවති විරෝධතාවයක් ආවරණය කිරීමේ දී ජනමාධ්‍ය වේදී කුමනන් කනපතිපිල්ලේට ආරක්ෂක හමුදා විසින් බාධා කරන ලදී. මාස 10කට පෙර ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බුද්ධි අංශයේ අධ්‍යක්ෂක විසින් කළ පැමිණිල්ලක් පිළිබඳව ගෝටාගෝගම

ක්‍රිකාරික සහ ජනමාධ්‍ය වේදී තරිඳු උඩුවරගෙදර ශ්‍රී ලංකා පොලීසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඔහුගේ යූ ටියුබ් නාළිකාව ගැන ප්‍රශ්න කර ඇත.

## 2022 ජූලි

ජූලි 22 උදේ පාන්දර හමුදාව කඩා වැදී විරෝධතාකරුවන් විසින් අත්පත් කරගෙන සිටි ජනාධිපති මහලේකම් කාර්යාලය සහ අවට භූමිය අත් කර ගත්තේය. හමුදාවේ කඩා වැදීම ආවරණය කරමින් සිටි ජනමාධ්‍යවේදීන් අඩුම වශයෙන් පස් දෙනෙකු අත් අඩංගුවට ගෙන වධ හිංසා පමුණුවන ලදී. ඔවුන්ගේ දුරකතන පැහැර ගෙන වීඩියෝ පටි හමුදාව විසින් බලහත්කාරයෙන් මකා දමන ලදී. සිවිල් ඇඳුමෙන් සිටි තමන් පොලීසියෙන්යැයි හඳුන්වා ගත් කණ්ඩායමක් එක්ස්පෝෂර් නිව්ස් කාර්යාලයට පැමිණ ඡායාරූපවල සිටින පුද්ගලයන් නම් කරන ලෙස ආරක්ෂකයන්ගෙන් ඉල්ලා සිටියහ. එමෙන්ම CCTV පටි බැලීමට සහ ඇතුලුවීම නිරීක්ෂණය කිරීමට පැයකට අධික කාලයක් ඔවුහු එහි ගත කළහ. ජූලි 09 වැනි දින අගමැතිගේ පුද්ගලික නිවස ඉදිරිපිට පැවති උණුසුම්කාරී තත්වයක් වාර්තා කරමින් සිටි සිරස රූපවාහිනියේ නිව්ස්පර්ස්ට් කණ්ඩායමේ ජනමාධ්‍ය වේදීන් අටකට ශ්‍රී ලංකා පොලීසියේ විශේෂ කාර්ය බලකායේ පිරිසක් විසින් පහර දී ඇතැයි චෝදනා කෙරේ. විරෝධතාවයන් ආවරණය කරමින් සිටිය දී කඳුලු ගෑස් ප්‍රහාර ගණනාවකට මුහුණ දීමට සිදු වූ නිසා දෙරණ රූපවාහිනියේ ජනමාධ්‍යවේදී ප්‍රදීප් සන්ජීව වික්‍රමසිංහට හුස්ම ගැනීමට අපහසු තත්වයක් ඇතිවීමෙන් රෝහල් ගත කිරීමට සිදු විය. ආණ්ඩුවට එරෙහි ජනතා විරෝධයට සහාය පළ කෙරෙන සටහනක් මුහුණු පොතේ පළ කිරීම නිසා බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල් ගුරුවරයෙකු වන ඒ ඇම් කුමාර අද්දරගේ සේවය අත්හිටුවා ඇත.

## 2022 අගෝස්තු

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ කලින් අත් අඩංගුවට ගෙන ඇප මත නිදහස් කරන ලද කවියෙකුවන අහ්නාෆ් ජසීම් ආරක්ෂක අමාත්‍යාංශය අගෝස්තු 1 වැනිදා නිකුත් කළ ලේඛනයක ත්‍රස්තවාදය සම්බන්ධ කටයුතුවල නිරත පුද්ගලයෙකු වශයෙන් නම් කර ඇත.

## 2022 සැප්තැම්බර්

දෙමළ ජ්‍යෝෂ්ඨ ජනමාධ්‍යවේදියෙකු වන ෂන්මුගම් තවසීලන් පුදුකුඩුඉරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදුව ඇතැයි කියන ඉන්ධන වංචාවක් පිළිබඳව පළ කළ වාර්තාවක් ගැන ප්‍රකාශයක් සටහන් කර ගැනීමට යාපනය දිස්ත්‍රික්කයේ මාන්කුලම් පොලිසියට කැඳවා ඇත. මඩකලපුවේ දෙමළ ජනමාධ්‍ය වේදීන්ගේ සංගමයේ ලේකම් සෙල්වකුමාරන් නිලන්තන්, දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයේ දේශපාලන අංශයේ මඩකලපුව ප්‍රධානි සමග සම්බන්ධතා තිබුණේයැයි කොළඹ ත්‍රස්තවාදය වැළැක්වීමේ විමර්ශන කොට්ඨාශයට කැඳවුයේය. මඩකලපුව දිස්ත්‍රික්කයේ දෙමළ ජනමාධ්‍ය වේදීන්ගේ සංගමයේ සභාපති බාලසිංහම් ක්‍රිෂ්ණකුමාර් ද ත්‍රස්තවාදය වැළැක්වීමේ විමර්ශන කොට්ඨාශයේ කොළඹ මූලස්ථානයට කැඳවා ඇති බව මඩකලපුව පොලිස් ස්ථානයේ නිලධාරීහු ඔහුට දැන් වූහ. රටේ පවතින ආර්ථික අර්බුදයෙන් හටගත් ආහාර හිඟකම නිසා සමහර ශිෂ්‍යයන්

ක්ලාන්ත වෙන බව සමහර නිලධාරීන් පවසා ඇති නිසා රජයේ සේවකයන්ට සමාජ මාධ්‍යය හරහා තම අදහස් පළ නොකරන මෙන් ආණ්ඩුවෙන් නියෝග කෙළේය. නිදහස් ලේඛිකාවක් වන දුලානි ප්‍රියදර්ශනී විරෝධතා ව්‍යාපාරයට ඇගේ ඇති සම්බන්ධතාවය ගැන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කොළඹ මූලස්ථානයට කැඳවා පැය 5කට අධික කාලයක් ප්‍රශ්න කර ඇත.

## 2022 ඔක්තෝබර්

මැතක පැවති සාමකාමී විරෝධතාවයක දී පොලිස් නිලධාරීන් දෙදෙනෙකුගේ ක්‍රියා කලාපය ගැන පැමිණිල්ලක් කිරීමට පොලිසියට ගිය අවස්ථාවේ දී කොටුව පොලිසියේ ස්ථානාධිපති තමාට තර්ජනය කෙළේයැයි ජනමාධ්‍ය වේදී තරිඳු ජයවර්ධන චෝදනා කෙළේය.

## 2022 නොවැම්බර්

මාස කීපයකට පෙර ඔවුන් සමාජ මාධ්‍යයේ පළ කළ සටහනක් පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ජනමාධ්‍ය වේදීන් වන තරිඳු ජයවර්ධන සහ තරිඳු උඩුවරගෙදර කැඳවා ඇත. දැනට රටින් පිටව සිටින මඩකලපුව දෙමළ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම් එස් නිලන්තන්ගේ නිවසට සිවිල් ඇඳුමෙන් සැරසුණ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ගොස් ඇත. තවත් සිද්ධියක දී හමුදා භටයින් මුලතිවු පුවත් සමාජයට ගොස් එහි මාධ්‍ය කේන්ද්‍රයට සම්බන්ධ ප්‍රධාන අයගේ තොරතුරු ලබා දෙන මෙන් ජනමාධ්‍යවේදී කුමනන්ගෙන් ඉල්ලා ඇත. ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ ගැන විශේෂයෙන් සඳහන් කරමින් ජනමාධ්‍ය ඇමති නිෂේධනීය පුවත් වාර්තා සහ ඡායාරූප පළ කිරීමෙන් ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යය රටේ කීර්ති නාමයට හානි සිදු කරන්නේයැයි පාර්ලිමේන්තු විවාදයකට එක්වෙමින් පැවසුවේය. තේ වත්ත සහ පෙදෙස් වාසීන් අතර පැවැත්වෙන සාකච්ඡා වාර්තා කිරීමේ දී ප්‍රාදේශීය ජනමාධ්‍ය වේදියෙකු වන සම්බසිවම් සතිස්කුමාර්ට කිර්කොස්වොල්ඩ් වත්තේ කළමනාකරණය සහ වතු අධිකාරි තර්ජනය කර ඇත.
හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රදේශයේ පවතින ළමා මන්දපෝෂණ තත්වය හෙළිදරව් කිරීම නිසා වෘත්තීය සමිති නායකයෙකු මෙන්ම වෛද්‍යවරයෙකු ද වන චමල් සංජීව ගේ වැඩ තහනම් කර ඇත. ඔහුගේ වඩ තහනම් කිරීමට හේතු ලෙස සෞඛ්‍ය අමාත්‍යංශය දක්වා ඇත්තේ සාවද්‍ය තොරතුරු මාධ්‍යයට ලබා දීම සහ මාධ්‍යයට කතා කිරීමට පෙර සෞඛ්‍ය අමාත්‍යංශයේ අවසර ලබා නොගැනීම ය.

## 2022 දෙසැම්බර්

දෙසැම්බර් 18 වැනි දා යූටියුබ් නාලිකාවේ සහ ජනමාධ්‍යවේදියෙකු වන චමුදිත සමරවික්‍රම ව්‍යාපාරකයෙකු වූ දිනේෂ් ෂාෆ්ටර් මරා දැමීම පිළිබඳව පවත්වන විමර්ශනයක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවූයේය. ඔහු විමර්ශන ජනමාධ්‍ය වේදියෙකු සහ ආරක්ෂක කටයුතු විශ්ලේෂකයෙකු වන කීර්ති රත්නායක සමග සාකච්ඡාවක් පවත්වා ඇත. කීර්ති රත්නායක ද කලින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන මාස කීපයකට පසු නිදහස් කර ඇති අතර යු ටියුබ් නාලිකාවේ සාකච්ඡා පවත්වා ඇත.

# 5. රැස්වීමේ නිදහස මර්දනය කිරීම.

## 2022 ජනවාරි

වාමාංශික දේශපාලන පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුණ සහ එහි සාමාජිකයන් සෝදිසියෙන් සිටීම, තර්ජනය කිරීම් සහ එහි නායකයාට සහ සාමාජිකයන්ට ප්‍රසිද්ධ රැස්වීම් දෙකක දී බිත්තර ප්‍රහාර එල්ල කිරීම ඇතුළත් විවිධාකාරයේ හිරිහැර කිරීම්වලට ලක්වේ. 1987 දී ශ්‍රී ලංකා හමුදාව සිදු කරන ලද සමූල ඝාතනයකින් මිය ගිය අය සිහි කිරීමට පැවැත්වීමට නියමිතව තිබූ උත්සවයකට පොලීසියෙන් බාධා පමුණුවන ලදී. සමහර වැඩ වර්ජන තහනම් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ගෙන ආ යුතුයැයි අධිකරණ ඇමති පැවසුවේය.

## 2022 පෙබරවාරි

වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන්ට ජනතාව පහර දිය යුතුයැයි අමාත්‍ය තිස්ස කුට්ටිආරච්චි විවාදයට තුඩුදුන් ප්‍රකාශයක් කෙළේය. රාජ්‍ය නොවන සංවිධානයක් වන ධීවර සහයෝගිතා දිස්ත්‍රික් කාර්යාලය ( **DIFSO)** විරෝධතාවයක් සැලසුම් කරන විට පොලීසිය එහි කඩා වැදුණේය. ජනාධිපති විදුලිය සහ සෞඛ්‍ය සේවා අත්‍යාවශ්‍ය සේවායැයි ප්‍රකාශ කෙළේය. අත්‍යාවශ්‍ය සේවායැයි නම් කිරීම වෘත්තීය සමිති පියවර වැළැක්වීමට සහ සීමා කිරීමට කලක සිටම ගන්නා පියවරකි. අධිකරණයෙන් හෙද වෘත්තීය සමිතියකට සහ එහි සභාපතිට එරෙහිව වාරණ නියෝගයක් නිකුත් කෙළේ එම වෘත්තීය සමිතිය වැඩ වර්ජනයක් කිරීමට සූදානම් වෙමින් සිටිය දීය. පසුගිය වසරේ මැයි 18 පවත්වන ලද අනුස්මරණයකට සහභාගි වූවන්ගේ තොරතුරු ලබා ගැනීමට ක්‍රියාකාරිකයෙකු ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට ( **TID)** කැඳෙව්වේය. කලු ගල් කැඩීමෙන් ප්‍රදේශයේ පරිසරයට සිදුවන හානිය නිසා විරෝධතා දැක් වූ ගම්වාසි පිරිසකට එරෙහිව ගල් කැඩීමේ සමාගමේ සේවක පිරිසක් උද්ඝෝෂණයක් පැවැත් වූහ. මහනුවර ලංකා කම්කරු රතුධජ සංගමයේ විරෝධතාවයක් පොලීසියෙන් විසිරුවා හරින ලදී.

## 2022 මාර්තු

විපක්ෂයේ දේශපාලන පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුණ, එම පක්ෂය සහ එහි සහාගය වන ජාතික ජන බලවේගය සංවිධානය කළ මහජන රැලියකට පහර දීමට තුලියට ගත් මැරයන් යෙදවීම සම්බන්ධයෙන් පාලක පක්ෂයේ දේශපාලකයන් සම්බන්ධ ආරක්ෂක සමාගමක් වන අවාන් ගාර්ඩ් සම්බන්ධයැයි ජනතා විමුක්ති පෙරමුණ චෝදනා කෙළේය. අගමැති ගේ යාපනය සංචාරයට එරෙහිව අතුරුදහන් වූවන්ගේ පවුල් සංවිධානය කළ විරෝධතාවයකට පොලිසියෙන් බාධා කෙරිණ. එම විරෝධතාවයට සම්බන්ධ වූ
ප්‍රාදේශීය මංත්‍රීන් දෙදෙනෙකු පසුව පොලීසියට කැඳවා විරෝධතාවයට ඔවුන්ගේ ඇති සම්බන්ධතාවය ගැන ප්‍රශ්න කර ඇත. යාපනායේ පැවති අන්තර්ජාතික කාන්තා දින විරෝධතාවයට සහභාගි වූවන්ට සහ එහි සංවිධායකයන්ට පොලීසියෙන් තර්ජනය කරන ලදී. ජනාධිපති ගේ කොළඹ ආසන්නයේ ඇති පුද්ගලික නිවස ඉදිරිපිට විරෝධතාවයක් පවත්වන විට පොලීසියෙන් ඇඳිරි නීතිය පනවා කඳුලු ගෑස් එල්ල කරන ලදී.

## 2022 අප්‍රේල්

තම නිල ඇඳුමෙන්ම ආණ්ඩු විරෝධී උද්ඝෝෂණයකට එක් වූ පොලිස් නිලධාරියෙකු පොලීසියෙන්ම අත් අඩංගුවට ගෙන ඔහුට විරුද්ධව නීති ක්‍රියා මාර්ග ගෙන ඇත.

රට පුරාම ආණ්ඩු විරෝධි උද්ඝෝෂණ සංවිධානය කරන විට ආණ්ඩුව ප්‍රසිද්ධ ස්ථානවල මහජනයා ගැවසීම තහනම් කෙරෙන ගැසට් පත්‍රයක් නිකුත් කෙළේය. ඒ සමගම ජනාධිපති හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කළ නිසා වරෙන්තුවක් නැතිව පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමට සහ රඳවා ගැනීමට හමුදාවට සහ පොලිසියට වැඩි බලතල හිමි විය. ස්ථාන ගණනාවක පැවති විරෝධතාවයන්ට පොලීසියෙන් කඳුලු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කෙරිණ. ඒවාට ජනාධිපති ගේ කොළඹ පුද්ගලික නිවස ඉදිරිපිට පැවති විරෝධතාවය, අගමැතිගේ තංගල්ල නිවස ඉදිරිපිට පැවති විරෝධතාවය, අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය[11] පාර්ලිමේන්තු වටරවුමේ පැවැත් වූ විරෝධතාවය. පේරාදෙණිය විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් සංවිධානය කළ විරෝධතාවය, රඹුක්කන ජනතාව සංවිධානය කළ විරෝධතාවය, කලුතර පොදුජන පෙරමුණේ කාර්යාලය ඉදිරිපිට පැවති විරෝධතාවය සහ නොයෙකුත් ප්‍රදේශවල පාර්ලිමේන්තු මංත්‍රීන්ගේ නිවෙස් ඉදිරිපිට පැවති විරෝධතාවයන් ඇතුළත් ය. රඹුක්කන විරෝධතාවයේ දී පොලිසිය එල්ල කළ වෙඩි ප්‍රහාරයෙන් එක් අයෙකු මිය ගිය අතර තවත් විශාල පිරිසකට තුවාල සිදු විය. වෙඩි තැබීමට පොලීසිය හේතු දැක් වූයේ විරෝධතාකරුවන් ඉන්ධන බවුසරයකට ගිනි තැබීමට උත්සාහ කෙළේය යන්නයි. ආණ්ඩුවට පක්ෂපාතී කණ්ඩායමක් ආණ්ඩු විරෝධීන් සංවිධානය කළ පහන් දැල්වීමේ විරෝධතාවයක් කඩා කප්පල් කිරිමට උත්සාහ කළහ. කොළඹ අගමැති ගේ නිල නිවස වූ අරලිය ගහ මන්දිරය ඉදිරිපිට පැවැත් වූ විරෝධතාවයක් නතර කිරීමට පොලීසිය අධිකරණ නියෝගයක් ලබා ගැනීමට ඉදිරිපත් විය. කොළඹ කොටුව දුම්රිය ස්ථානය ඉදිරිපිට පැවති විරෝධතාවයක් නතර කිරීමට ද නියෝගයක් ලබා ගැනීමට පොලීසිය අධිකරණයට ඉදිරිපත් වූයේය. එහෙත් අධිකරණයෙන් එම තහනම ලබා දීම ප්‍රතික්ෂේප කෙරිණ. බදුල්ලේ රිදිමාලියැද්ද ප්‍රා දේශීය සභාවේ සභාපති විරෝධතාකරුවෙකුට පහර දීම නිසා උණුසුම් තත්වයක් ඇති විය. කලින් රාජපක්ෂ පාලන සමයේ මරා දැමූ, පහරදුන් සහ අතුරුදහන් කළ අයගේ පින්තූර සහිත බැනරයක් ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරිහු ඉවත් කළහ. ගෝටාගෝහෝම්2022 ගම මුහුණු පොත් කණ්ඩායමට සම්බන්ධ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෙකු පැහැර ගෙන ගිය අතර පසුව ඔහු පොලිස් අත් අඩංගුවට ගත් බව ප්‍රකාශ කෙරිණ. ආණ්ඩුවේ ආයතනයක වැඩ කරන හිටපු මලල ක්‍රීඩකයෙකු ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට සහාය පළ කිරීම නිසා වාචික තර්ජනවලට ලක් වූයේය. පාර්ලිමේන්තු මංත්‍රී රාසමානික්කම්ට විරෝධතාවයන්ට සහභාගිවීම තහනම් කරන අධිකරණ නියෝගයක් නිකුත් කර ඇත. ඉන්දියානු සාම සාධක හමුදාවේ කුරිරුකම්වලට එරෙහිව 1988 දී උපවාසයක් කිරීමෙන් මිය ගිය අන්නායි පූපති අනුස්මරණය කිරීමේ උත්සවයක් පැවැත්වීම තහනම් කිරීමේ නියෝගයක් මඩකලපුව මහෙස්ත්‍රාත් නිකුත් කෙළේය. ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව විරෝධතා දැක් වූ බස් රියැදුරෙකුට ජ්‍යෝෂ්ඨ පොලිස් නිලධාරියෙකු පහර දුන්නේය.

[11] Inter University Student Federation

## 2022 මැයි

2022 මැයි 9 වැනි දා පාලක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආධාරකරුවන් පිරිසක් අගමැති මහින්ද රාජපක්ෂ සමග අරලිය ගහ මන්දිරයේ පැවති රැස්වීමකින් පසුව අරලිය ගහ මන්දිරය ඉදිරිපිට සහ ඉන් පසුව ගාලු මුවදොර පිටියේ සාමකාමීව විරෝධතාවයේ යෙදුන පිරිසට පහර දුන්හ. ජනාධිපති ලේකම් කාර්යාලය සහ ඒ අවට ඇති පුද්ගලික සමාගම්වල පිවිසීමට බාධාවන නිසා විරෝධතාකරුවන් ඉදි කර ඇති කූඩාරම් ඉවත් කිරීමට හදිසි නියෝගයක් ලබා දෙන ලෙස පොලීසිය අධිකරණයෙන් ඉල්ලීමක් කෙළේය. 2022 මැයි 16 කන්තලේ පොලීසිය නැගෙනහිර පළාතේ කන්තලේ මහවැලි විද්‍යාලයේ පුස්තකාල සහකාර සුසන්ත රඹුක්වැල්ල විරෝධතාවලට සහභාගි වූයේයැයි අත් අඩංගුවට ගෙන ඇත. 2022 මැයි 13 රාත්‍රියේ පොලීසිය කටුනායක අපනයන කලාපයේ ලංකා නයිගායි (පුද්ගලික) සමාගමේ සේවකයෙකු වන ප්‍රබෝධ ලක්ෂාන් විරෝධතාවලට සහභාගිවීම නිසා අත් අඩංගුවට ගෙන ඇත. 2022 මැයි 19 අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය සංවිධානය කළ විරෝධතාවයකට පොලීසිය කඳුලු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කෙළේය. කොළඹ කොටුව පොලීසිය කොටුව මහෙස්ත්‍රාත් උසාවියෙන් කරන ලද ඉල්ලීමක් අනුව ජාතික උසස් ඩිප්ලෝමා ශිෂ්‍යයන්ට කොළඹ කොටුවේ සමහර මාර්ග, රජයේ ආයතනවලට පිවිසීම හෝ අලාභ හානි කිරීම සහ පොලිසියේ රාජකාරියට බාධා කිරීම තහනම් කිරීමේ නියෝගයක් නිකුත් කරන ලදී. උසාවි නියෝගය නොසලකා ශිෂ්‍යයන් 2022 මැයි 21 විරෝධතා පෙළපාලි පැවැත් වූ නිසා පොලීසිය කඳුලු ගෑස් සහ ජලප්‍රහාර එල්ල කෙළේය. 2022 මැයි 29 වැනි දා වෛද්‍ය පීඨයේ ශිෂ්‍යයන් පැවැත් වූ විරෝධතාවයක් ද ඒ ආකාරයෙන්ම විසුරුවා හරින ලදී. වැඩි දුර පැවැත්වෙන විමර්ශන සඳහා ඔවුන් ලංකාවේ සිටීම අවශ්‍ය වන නිසා කොළඹ කොටුව මහෙස්ත්‍රාත් මැයි 9 වැනිදා ආණ්ඩුවට හිතවාදී පිරිස් එල්ල කළ මැර ප්‍රහාරයෙන් තුවාල ලැබූ අය ඇතුළත් ඇසින් දටු සාක්ෂිකරුවන් ඇතුළත් හත් දෙනෙකුට සංචාරක තහනමක් පැන වූයේය. ක්‍රියාකාරිකයෙකු සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණවේදින්ගේ සංගමයේ සභාපති ඉන්දික ගමගේ මැයි 9 වැනි දා විරෝධතාකරුවන්ට පහර දීමේ සිද්ධියට අදාලව මාතලේ පොලීසිය විසින් 2022 මැයි 27 අත් අඩංගුවට ගනු ලැබිණ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ දෙමපියන්ගේ සොහොන විකාශ කිරීම ගැන දේවාලෙගම ප්‍රේමරතන හිමි ගෙන් ප්‍රශ්න කිරීමෙන් පසු මැයි 9 වැනි දා සිද්ධීන් සම්බන්ධයෙන් වීරකැටිය පොලීසිය 2022 මැයි 26 කැඳවා ඇත. ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට ක්‍රියාකාරීව දායක වූ පරිසරවේදීන් දෙදෙනෙකු වන නුවන් නීලමුනි සහ හර්ෂණ නීලමුනි 2022 මැයි 26 අම්බලන්ගොඩ පොලිසිය විසින් අත් අඩංගුවට ගෙන ඇත. අරලියගහ මන්දිරය පිටුපස විරෝධතාකරුවන් විසින් ඉදි කර ඇති සියලු දේ, වාහන සහ වෙනත් සියලු දේ ඉවත් කරන මෙන් කොළඹ කොටුව මහෙස්ත්‍රාත් 2022 මැයි 4 නියෝගයක් නිකුත් කෙළේය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගමක් වන පන්නල සමන් කුමාර රත්නතිලක සහ තවත් අයකු 2022 මැයි 1 දින ගම්පහ දිස්ත්‍රික්කයේ පන්නල පොලීසියෙන් අත් අඩංගුවට ගෙන ඇත. මේ දෙදෙනා අත් අඩංගුවට ගෙන ඇත්තේ ආණ්ඩු විරෝධී උද්ඝෝෂණයකට සහභාගිවීම සහ මාධ්‍යයට කතා කිරීම නිසාය. යූ ටියුබ් සන්නිවේදක රතිඳු සේනාරත්න (රටටා) විරෝධතාවයකට සහභාගිවීමෙන් අධිකරණ නියෝගයක් කඩ කර ඇතැයි කොම්පඤ්ඤවීදිය පොලීසියෙන් 2022 මැයි 30 වැනි දා අත් අඩංගුවට ගත්තේය. කොළඹ දෙමටගොඩ ගෑස් හිඟකම ගැන විරෝධතාවයක් දැක් වූ ජනතාවට ප්‍රෙදේශයේ දේශපාලකයෙකුගේ මැර කණ්ඩායක් පහර දුන්හ. මෙම සිද්ධිය මුහුණු පොත හරහා ප්‍රචාරය කරමින් සිටි පුද්ගලයෙකුට ද පහර දී ඇත. කුරුණෑගල ගෝටාගෝහෝම් ගම උද්ඝෝෂණ ව්‍යාපාරයට

ක්‍රියාශීලීව දායක වූ තරුණයෙකු වාරියපොළ අමිල මෙන්ඩිස් කුරුණෑගල නගරාධිපතිගේ මැයි 16 දින පැමිණිල්ලක් අනුව පොලිසියෙන් අත් අඩංගුවට ගෙන රඳවා ඇත.

## 2022 ජුනි

ශ්‍රේෂ්ඨාධිකරණය ගාලු මුවදොර සාමකාමී විරෝධතා පවත්වන ස්ථානය ඉවත් නොකිරීමට පොලිසියට නියෝග කරමින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් නිෂ්ප්‍රභ කෙළේය. ජුනි මස තලංගම සහ කොටුව ප්‍රදේශයේ විරෝධතා ව්‍යාපාරවලට සහභාගී වූ ප්‍රධාන ක්‍රියාකාරීන් නම දෙනෙකු අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට කොටුව මහෙස්ත්‍රාත් පොලිසියට නියෝග කෙළේය. හිටපු දෙමළ කැරලිකරුවෙකු සහ ක්‍රියාකාරිකයෙකු වන වේලුපිල්ලේ මාදවමේජර්ට මුලතිවු හි හින්දු කෝවිලක ඉඩම් පවරා ගැනීමට එරෙහි විරෝධතා ව්‍යාපාරයකට සහභාගී වීම නිසා හමුදාවෙන් තුවක්කු එල්ල කර තර්ජනය කර ඇත. ඉන්ධන ඉල්ලා පැවැත් වූ විරෝධතාවයකට සහභාගී වූ පුද්ගලයෙකුට මාතර මහෙස්ත්‍රාත් උසාවියෙන් වසර තුන හමාරක බරපතළ වැඩ සහිත සිරදඬුවමක් නියම කෙරිණ. ඔහුට ඉදිරිපත් චෝදනාව වූයේ පොලිස් ත්‍රිරෝද රථයකට අලාබ හානි සිදු කිරීම සහ පොලිසියේ රාජකාරියට බාධා කිරීම ය. 2022 ජුනි 2 විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් විහාරමහා දේවි උද්‍යානයේ සිට කොළඹ පිහිටි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම දක්වා යෑමට සැලසුම් කළ විරෝධතා පෙළපාලියක් නතර කිරීමට තහනම් නියෝගයක් නිකුත් කරන මෙන් පොලිසියෙන් කළ ඉල්ලීම කොළඹ මහෙස්ත්‍රාත් ප්‍රතික්ෂේප කෙළේය. 2022 ජුනි 20 වැනි දින අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ නිලධාරීන් සමග සාකච්ඡාවක් පැවැත්වීමට නියමිතව තිබූ කොළඹ ජනාධිපති ලේකම් කාර්යාලය සහ මුදල් අමාත්‍යංශයේ පිවිසුම් දොරටුවලට බාධා කිරීම නිසා විරෝධතාකරුවන් විසි එකක් අත් අඩංගුවට ගෙන ඇත. 2022 ජුනි 09 පොලිස් මූලස්ථානය ඉදිරි පිට පැවති විරෝධතාවයක් විසුරුවා හැරීමට පොලිසිය කඳුලු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කෙළේය. තරගකාරි මිල ගණන් කැඳවීමේ ක්‍රියාවලියක් නැතිව සමහර විදුලි බලාගාර ව්‍යාපෘති ඉදි කිරීමට බලය පැවරෙන ආකාරයට 2013 අංක 31 විදුලිබල මණ්ඩල පනත සංශෝධනය කිරීමට මෑතක දී කළ යෝජනාවට විරුද්ධව විදුලිබල මණ්ඩල ඉංජිනේරු සංගමය දීප ව්‍යාප්ත වැඩ වර්ජනයකට සූදානම් විය. එවිට ජනාධිපති විදුලිය අත්‍යවශ්‍ය සේවාවක් බව ගැසට් නිවේදනයකින් ප්‍රකාශ කෙළේය. ආණ්ඩු විරෝධී උද්ඝෝෂක කණ්ඩායමක් 2022 ජුනි 04 පැවැත්වීමට නියමිතව තිබූ පෙළපාලියකට කොළඹ කොටුව මහහෙස්ත්‍රාත් තහනම් නියෝගයක් නිකුත් කෙළේය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට ඉල්ලා අස්වීමට බල කරමින් ගාල්ල කොටු තාප්පය ඉදිරිපිට නීතිඥයන් 2022 ජූලි 30 දින පැවැත් වූ විරෝධතාවයක් හමුදාවෙන් කඩා කප්පල් කර දැමුවේය. අසළ තිබූ ක්‍රීඩාංගනයේ සිට ක්‍රිකට් තරගයක් නරඹමින් සිටි පිරිසකට විරෝධතාවයෙන් බාධා පැමිණුනේයැයි හමුදාවෙන් ප්‍රකාශ කර තිබිණ. 2022 ජුනි 12 මුලතිවු හි කුරුතුමලෙයි හි හින්දු කෝවිලක් සතු ඉඩම් පවරා ගැනීමට එරෙහිව විරෝධතා දැක් වූ දෙමළ ජාතික ජනතා පෙරමුණේ සාමාජිකයන් තිදෙනෙකු ශ්‍රීලංකා පොලිසිය විසින් අත් අඩංගුවට ගනු ලැබිණ. වෙනත් සිද්ධියක දී 2022 ජුනි 07 මුලතිවු හි ගෝඨාභය නාවික හමුදා කඳවුර පුළුල් කිරීමට ඉඩම් අත්පත් කර ගැනීමට එරෙහිව විරෝධතා දැක් වූ පිරිසකට පොලිසියෙන් තර්ජනය කෙළේයැයි වාර්තා වේ. ජනතා නීතිඥ සංගමයේ කැඳවුම්කරු සහ ක්‍රියාකාරක නීතිඥ සේනක පෙරේරා 2022 ජුනි 06 වැනි දින විරෝධතාකරුවන් ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට පෙළඹවීමේ චෝදනාව යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබිණ. මැයි 9 වැනි දා විරෝධතාකරුවන්ට කුරිරු ප්‍රහාරයක් එල්ල කිරීම හෙළා දකිමින් මුහුණු පොතේ සටහනක් තැබීම නිසා 2022 ජුනි 6 වැනි

දා ක්‍රියාකාරිකයෙකු වන චන්ද්‍රලාල් අබේගුණසේකට ගාල්ල පොලීසියේ අපරාධ පරීක්ෂණ ඒකකයට කැඳවා තිබිණ. කුරුණෑගල ගෝටාගෝහෝම් ගම ක්‍රියාකාරිකයන් වන අදීප ඒකනායක සහ ප්‍රින්ස් ජයසූරිය 2022 ජූනි 07 කුරුණෑගල නියෝජ්‍ය පොලිස්පති කාර්යලයට කැඳවා ඇත. කොළඹ ගෝටාගෝහෝම් ගම ප්‍රධාන ක්‍රියාකාරිකයෙකු වන අමල් සාලින්ද, ශිෂ්‍ය ක්‍රියාකාරිකයන් සහ තවත් අය සංවිධානය කළ විරෝධතාවයකට සහභාගී වී ආපසු එමින් සිටිය දී ජූනි 20 අත් අඩංගුවට ගෙන ඇත. මැයි 9 වැනි දා ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවෙමින් පැවතිය දී නිවසකට සහ දේශපාලකයෙකුගේ නිවසට ගිනි තැබීමේ සිද්ධියක් සම්බන්ධයෙන් මහාචාර්ය නැදලගමුවේ ධම්මදින්න හිමි ගම්පහ පොලිසියට කැඳවා තිබිණ. පොලිසිය පෙරටුගාමී පක්ෂයේ කොළඹ කාර්යාලසට පහර දීමට තැත් කෙළේය.

## 2022 ජූලි

2022 ජූලි 7 වැනි දා ජනාධිපතිට ඉල්ලා අස්වීමට බල කෙරෙන ආගමික නායකයින්ගේ කණ්ඩායමක් පැවැත් වූ විරෝධතාවයක් තහනම් කිරීමට කොටුව පොලීසිය අධිකරණ නියෝගයක් ලබා ගත්තේය. 2022 ජූලි 06 කොළඹ ජනාධිපති මන්දිරය පිටුපස විරෝධතාවයක් පැවැත්වීම නිසා හිටපු පාර්ලිමේන්තු මංත්‍රිනී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර සහ තවත් 11ක් පොලීසියෙන් අත් අඩංගුවට ගත්තේය. ජූලි 8 වැනි දා කොළඹ දිස්ත්‍රික්කයේ බොහෝ තැන්වලට පොලිසියෙන් ඇඳිරි නීතිය පනවන ලදී. මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් සීමා කරමින් එවැනි ඇඳිරි නීතියක් පැනවීමට පොලිස්පතිට බලයක් නැතැයි නීතිඥ සංගමය ලිපියක් යවමින් පෙන්වා දුන්නේය.

ජූලි 9 වැනි දා විරෝධතාකරුවෝ ජනාධිපතිට ඉල්ලා අස්වීමට බල කරමින් ආණ්ඩුවේ ප්‍රධාන ගොඩනැගිලි කීපයක් අත්පත් කර ගත්හ. විරෝධතාකරුවෝ ජූලි 21 ජනාධිපති ලේකම් කාර්යාලය අදාල බලධාරීන්ට භාර දීමට සූදානම්යැයි ප්‍රකාශ කළහ. ගොඩනැගිලි භාර දීමට සියලු කටයුතු සූදානම්ව තිබිය දී ජනාධිපති ලේකම් කාර්යාලය පරිශ්‍රයේ සහ අවට මාවත් දෙපස කූඩාරම් ඉදි කර ගෙන නිදා සිටි විරෝධතාකරුවන්ට පූර්ව දැනුම් දීමකින් තොරව 2022 ජූලි 22 පාන්දර හමුදාවෙන් අමානුෂික ලෙස පහර දුන්හ. 50කට අධික පිරිසකට තුවාල සිදු වූ අතර නීතිඥයෙකු ජනමාධ්‍යවේදියෙකු ඇතුලු 50කට අධික පිරිසක් අත් අඩංගුවට පත් වූහ. විරෝධතා පැවති ස්ථානය තුළ පිහිටි බණ්ඩාරනායක පිළිරුව අවට මීටර් 50ක වට ප්‍රමාණයේ ප්‍රදේශයක විරෝධතාකරුවන්ට රැස්වීම තහනම් කරමින් කොළඹ කොටුව මහෙස්ත්‍රාත් නියෝගයක් නිකුත් කෙළේය.

2022 ජූලි 31 දින කැළණිය විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයේ උපාධි අපේක්ෂක සහ ශිෂ්‍ය ක්‍රියාකාරිකයෙකු හඳුනා නොගත් පිරිසක් පැහැර ගත්හ. ප්‍රකට ශිෂ්‍ය නායකයන් ගැන ප්‍රශ්න කිරීමෙන් පසුව ඔහු මහ මග අතහැර දමා ගෙස් තිබිණ. ශිෂ්‍ය ක්‍රියාකාරීන් විසින් සංවිධානය කළ විරෝධතා ව්‍යාපාරයක් වැළැක්වීමට කොළඹ කුරුඳුවත්ත පොලීසිය අධිකරණයෙන් ඉල්ලීමක් කළ ද එය ප්‍රතික්ෂේප කෙරිණ. ජූලි 25 වැනි දා ගාලු මුවදොර විරෝධතාවයේ කැපී පෙනෙන ක්‍රියාකාරීන් හය දෙනෙකුට සංචාරක තහනමක් පනවන ලදී. ජූලි 28 වැනි දා ගාලු මුවදොර විරෝධතාවයට සම්බන්ධ තවත් ක්‍රියාකාරිකයන් 21කට සංචාරක තහනම් නිකුත් කරන ලදී. පාර්ලිමේන්තුව ඉදිරිපිට උද්සෝෂණයකට පිරිස් රැස් කෙළේයැයි සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෙකු වන පැතුම් කර්නර් 2022 ජූලි 22 අත් අඩංගුවට ගෙන ඇත. ඔහු #GotaGoHome පූරක ඇමිණුම (hashtag ) නිර්මාතෘයැයි සැලකේ. කොළඹ විරෝධතා ව්‍යාපාරයේ කැපී පෙනෙන චරිතයක් වූ අමිල ජීවන්ත පීරිස් පියතුමා

සොයා පොලිස් කණ්ඩායමක් 2022 ජුලි 27 රත්නපුර පල්ලියකට කඩා වැදුණහ. කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණය ආණ්ඩු විරෝධී ගෝටාගෝහෝම් උද්ඝෝෂණ ව්‍යාපාරයේ කැපී පෙනෙන නායකයන් දෙදෙනෙකු වූ ලහිරු වීරසේකර සහ තැම්පිටියේ සුගතානන්ද හිමි අත් අඩංගුවට ගැනීමට වරෙන්තු නිකුත් කෙළේය.

2022 ජුලි 22 වැනි දා සවස ලෝටස් පාර ඔස්සේ ගාලු මුවදොර පිටියට පිවිසීමට ගමන් කළ විරෝධතාකරුවන්ට ශ්‍රී ලංකා නාවික හමුදාව බාධා පමුණුවා ඔවුන්ට පොලුවලින් පහර දෙන ආකාරය වීඩියෝ පටිවලින් දැකිය හැකිය. ජුලි 28 වැනි දා තවත් ගාලු මුවදොර විරෝධතාකරුවෙකු වන ඉස්මට් මවුලවි අත් අඩංගුවට ගෙන ඇත. 2022 ජුලි 21 මැර කණ්ඩායමක් ඇඹිලිපිටිය ආණ්ඩු විරෝධී විරෝධතා පැවැත් වූ ස්ථානයට කඩා වැදී එය විනාශ කළහ. ජුලි 09 වැනි දා විරෝධතාකරුවන් ජනාධිපති මන්දිරයට කඩා වැදුණ අවස්ථාවේ එහි තිබී සොයා ගත් මුදල් ගණන් කර බලධාරීන්ට භාර දුන් හතර දෙනෙකු පොලීසියෙන් අත් අඩංගුවට ගන්නා ලදී. 2022 ජුලි 9 වැනි දා ජනාධිපති ගේ ධජය හොරකම් කෙළේයැයි චරාය සමගි සේවක සංගමයේ හිටපු උප සභාපති උදේනි කලුතන්ත්‍රි ජුලි 29 වැනි දා පොලිසියෙන් අත් අඩංගුවට ගෙන ඇත. ජුලි 22 වැනි දා හමුදාව කඩා වැදුණ අවස්ථාවේ දි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ භටයින් තරුණ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෙකුවන සහන් රන්ජක වීරවර්ධන රඳවා ගෙන පහර දුන්නේයැයි පවසයි. කොළඹ පැවති විරෝධතාවයකට සහභාගි වී ආපසු බසයකින් පැමිණෙමින් සිටි ජනමාධ්‍ය වේදී සහ අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ ශිෂ්‍ය ක්‍රියාකාරිකයෙකුවන වෙරංග පුෂ්පික පොලීසියෙන් පැහැර ගෙන ගොස් ඇත. ජුලි 29 වැනි දා පොලීසිය පෙරටුගාමී පක්ෂයේ කාර්යාලය පරික්ෂාවට ලක් කර ඇත.

## 2022 අගෝස්තු

ජුලි 9 වැනි දා කොළඹ ජනාධිපති ලේකම් කාර්යාලයට බලහත්කාරයෙන් කඩා වැදී එහි දේපොළවලට හානි සිදු කෙළේයැයි සැක කරන විරෝධතාකරුවන් 72ක් හඳුනා ගැනීමට පොලීසිය මහජනතාවගෙන් සහාය පැතීය. ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ හා සම්බන්ධ 'අරගලය සඳහා වූ ජාතික කේන්ද්‍රය'' නම් ආයතනයේ මාධ්‍ය සම්පන්ධීකාරක වශයෙන් පත් කිරීමට නියමිතව සිටි ජනමාධ්‍යවේදී මංජුල සමරසේකර පොලීසියෙන් තමා අත් අඩංගුවට ගැනීමට පැහැදිලිවම උත්සාහ කරන බව පෙනෙන්නේයැයි චෝදනා කෙළේය.

යූ ටියුබ් ක්‍රියාකාරික රටිඳු සේනාරත්න සහ ජාතික ඩිප්ලෝමා ශිෂ්‍ය මණ්ඩලයේ කැඳවුම්කරු හරිත දර්ශන විදෙස් ගමන්වල යෙදීම තහනම් කරමින් අධිකරණයෙන් නියෝග කෙරිණ. ආණ්ඩුවට ඉල්ලා අස්වීමට සහ සමාජ ආර්ථික අර්බුදයට විසඳුම් ලබා දෙන ලෙස ඉල්ලා අගෝස්තු 18 කොළඹ පැවති විරෝධතාවලදී 19 දෙනෙකු අත් අඩංගුවට ගන්නා ලදී. අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය අත් අඩංගුවට ගෙන ඇති ශිෂ්‍ය ක්‍රියාකාරිකයන් ඇතුලුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ඇති සියලු රැඳවියන් නිදහස් කරන මෙන් ඉල්ලා කොළඹ දී තවත් විරෝධතාවයක් සංවිධානය කර තිබිණ. එහි දී ජල ප්‍රහාර සහ කඳුලු ගෑස් එල්ල කොට විරෝධතාකරුවන් 27ක් අත් අඩංගුවට ගෙන ඇත. පොලීසිය උසස් ජාතික ඩිප්ලෝමා ශිෂ්‍ය මණ්ඩලයේ කැඳවුම්කරු හරිත දර්ශනගේ නිවසට ගොස් ප්‍රකාශයක් සටහන් කර ගැනීමට පොලීසියට පැමිණෙ මෙන් දන්වා ඇත.

පොලිස් නිලධාරීන් සිවු දෙනෙකු ලංකා ගුරු සංගමයේ කොළඹ කාර්යාලයට පැමිණ එහි ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින් ගැන විමසා ඔහු රාත්‍රිය ගත කරන ස්ථානය ගැන තොරතුරු විමසා ඇත. කලින් මාසයේ ඔහු සංවිධානය කළ විරොධතාවයක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට මෝදර පොලිසියට කැඳවා ඇත. එම විරෝධතාවය සම්බන්ධයෙන්ම කම්කරු අරගල මධ්‍යස්ථානයේ සංවිධායක ලේකම් වරාය පොලිසියට කැඳවා තිබිණ. 2022 අගෝස්තු 18 දින අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය සංවිධානය කරන ලද විරෝධතාවයකට සහභාගී වී ආපසු පැමිණෙමින් සිටිය දී සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකු වන චින්තක රාජපක්ෂ අත් අඩංගුවට පත් විය. ජූලි 9 වැනි දා විරෝධතාවයට සහභාගි වූ තරුණයෙකු කොළඹ අපරාධ අංශයෙන් අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කර ඇත.

මැතක පැවති ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට සහභාගි වූ තරුණයන් සිවු දෙනෙකු 2022 අගෝස්තු 22 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඇත. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන ලක්මාල් දේවප්‍රිය පොලීසියෙන් අත් අඩංගුවට ගෙන ඇත. මැතක පැවති විරෝධතාවයක දී රඟුමක් ඉදිරිපත් කළ තරුණ රංගන ශිල්පියෙකුවන ෂාලික රුක්ෂාන් සේනාධීර 2022 අගෝස්තු 23 පොලීසියෙන් වොක්ස්හෝල් වීදියේ දී අත් අඩංගුවට ගන්නා ලදී. ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට සහභාගි වූ තරුණයන් දෙදෙනෙකු වන පියත් නිකේෂළ සහ නුවන් නීලමුනි 2022 අගෝස්තු 22 කොළඹ කොම්පඤ්ඤ වීදිය පොලීසියට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඇත.

මැතක පැවති විරෝධතාවයකට සහභාගි වූ තරුණයෙකු වන සහජා මධුශංක 2022 අගෝස්තු 22 පොලීසියෙන් අත් අඩංගුවට ගෙන ඇත. කොළඹ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය 2022 අගෝස්තු 15 දින මන්නාරමේ සමාජ ක්‍රියාකාරිකයෙකු වන වී ඇස් සිවකරන් කැඳවා ඇත. ජනාධිපති කාර්යාලයට බලහත්කාරයෙන් ඇතුලුවීම සම්බන්ධයෙන් පොලිසියේ විශේෂ විමර්ශන ඒකකය 2022 අගෝස්තු 1 වැනි දා පන්නිපිටියේ දී 38 හැවිරිදි පුද්ගලයෙකු අත් අඩංගුවට ගත්තේය. ශ්‍රී ලංකාවේ හිටපු පිහිනුම් ශූර ජූලියන්ග් බෝලිං සහ ව්‍යාපාරික ජොනතන් මාර්ටන්ස්ටින් 2022 අගොස්තු 17 අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ඇත.

ජූලියන් බෝලිං සහ ට්‍රාන්ස්පෙයරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය හිටපු අගමැති මහින්ද රාජපක්ෂ සහ දැනට සිටින ජනාධිපති සහ අනෙකුත් අය ඇතුළත් වගඋත්තරකරුවන් 13කට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොණු කර ඇත. නිට්ටඹුව පොලීසියේ පොලිස් නිලධාරිහු ශ්‍රී ලංකාවේ පවතින විරෝධතා ව්‍යාපාරයට සහාය දැක්වීමට පැරීසියේ උද්ඝෝෂණයක් සංවිධානය කිරීමට සම්බන්ධ වූයේයැයි ප්‍රංශයේ නේවාසික අර්ජුන් අමදෝරු අත් අඩංගුවට ගත්හ. බ්‍රිතාන්‍ය ජාතික සමාජ මාධය ක්‍රියාකාරිණියක් වන කේලේ ප්‍රේශර් ගේ ගමන් බලපත්‍රය අත් අඩංගුවට ගෙන පසුව ඇයගේ විසා බලපත්‍රය අවලංගු කර රටින් පිටවීමට නියෝග කරන ලදී. මොණරාගල නීතිඥයෙතු වන ඉන්දික අබේරත්න මැතක පැවති ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට සහභාගිවීම සම්බන්ධයෙන් 2022 අගොස්තු 31 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවනු ලැබීය.

මැතක පැවති ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට සම්බන්ධවීම පිළිබඳව පද රචකයෙකු සහ වෘත්තීය මෝස්තර ශිල්පියෙකු වන සංජය ඇපා සෙනෙවිරත්න කුරුඳුවත්ත පොලීසියට කැඳවා ඇත. පොලිස් ප්‍රචණ්ඩතා හෙළා දැකීමට වෘත්තීය සමිති සහ ක්‍රියාකාරිකයන් කණ්ඩායමක් කැඳවූ පුවත් පත්

සාකච්ඡාවක් අරගලය හා සම්බන්ධ ක්‍රියාකාරිකයෙකු අත් අඩංගුවට ගැනිමට පැමිණි පොලීසිය විසින් කඩා කප්පල් කරන ලදී. වරාය පොලීසියේ පොලිස් කණ්ඩායමක් ජාතික භික්ෂු පෙරමුණේ මාධ්‍ය ලේකම් කොස්වත්තේ මහානාම හිමි අත් අඩංගුවට ගැනීමට කොළඹ පන්සලකට කඩා වැදුණහ.

## 2022 සැප්තැම්බර්

මුලතිවු හි රජයේ අනුග්‍රහයෙන් පනසලක් ඉදි කිරීමට විරෝධය දැක් වූ උද්ඝෝෂණයකට සහභාගිවීම සම්බන්ධයෙන් පළාත් සහ ප්‍රාදේශීය දේශපාලකයන් දෙදෙනෙකු ඇතුළත් තිදෙනෙකු අත් අඩංගුවට පත් වූහ. රනිල් වික්‍රමසිංහ කොළඹ අධි ආරක්ෂක කලාප කීපයක් ප්‍රකාශයට පත් කළ දිනට පසුව කොළඹ පැවති විරෝධතාවයක් නීති විරෝධීයැයි පැවසූ බලධාරීහු භික්ෂූන් තිදෙනෙකු, කාන්තාවන් සිවු දෙනෙකු ඇතුළත් 84ක් සැප්තැම්බර් 23 අත් අඩංගුවට ගත්හ. පොලිස් පහර දීම නිසා විරෝධතාකරුවන් අඩුම වශයෙන් හත් දෙනෙකු රෝහල් ගත කරන ලදැයි වාර්තාවේ.

1987 දී මාරාන්තික උපවාසයකින් මිය ගිය එල්ටීටීඊයේ දේශපාලන අංශයේ නායක තිලීපන් අනුස්මරණය සඳහා වූ සංචාරක සිහිවටනයක් ශ්‍රී ලංකා හමුදාවෙන් නතර කොට තර්ජනය කර ඇත. රාජ්‍ය බැංකුවක වෘත්තීය සමිති සාමාජිකයන් අටක් සහ ලංකා ගුරු සංගමයේ විධායක කාරක සභාවේ සාමාජිකයෙකු විරෝධතාවයන්ට සහභාගිවීම පිළිබඳව ප්‍රශ්න කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවන ලදී. මැයි 9 වැනි දා ආණ්ඩුවට හිතවත් මැර කණ්ඩායම්වල දරුණු ප්‍රහාරයට ලක් වූ විරෝධතා ව්‍යාපාරයට ක්‍රියාත්මකව දායක වූ ඔශාන්ත ප්‍රසාද් දාබරේ ගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවන ලදී.

විරෝධතා ව්‍යාපාරයේ දී දිවි අහිමි වූ අය සිහිපත් කිරීමේ උත්සවයකට සැප්තැම්බර් 9 වැනි දා සහභාගි වී ආපසු පැමිණෙමින් සිටි 'වෙනසක් සඳහා තරුණයෝ'' ජාතික සංවිධායක සහ ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ ව්‍යාපාරයේ නායකයෙකු මෙන්ම හිටපු ශිෂ්‍ය ක්‍රියාකාරික ලහිරු වීරසේකර අත් අඩංගුවට ගන්නා ලදී. 2022 ජුලි 9 ජනාධිපති කාර්යාලයට නීති විරෝධීව පිවිසි කණ්ඩායමේ සාමාජිකාවක් වූ රංගන ශිල්පි දමිතා අබේරත්න කොළඹ අපරාධ කොට්ඨාශයෙන් අත් අඩංගුවට ගන්නා ලදී.

වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන සන්ධානය ශ්‍රී ලංකා සේවා මුක්ත සංගමයේ රැස්වීම් ශාලාවේ පැවැත්වීමට නියමිතව තිබූ රැස්වීමේ ස්ථානය වෙනස් කිරීමට සිදු වූයේ ආරක්ෂක අමාත්‍යංශයේ නියෝග අනුව ශාලාව ලබා නොදීම නිසායැයි වාර්තා වේ. අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය සහ වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන කොළඹ හයිඩ් පිට්ටනියේ මහජන රැලියක් පවත්වමින් තිබිය දි විදුලි බලය කපා හරින ලදී. සිවිල් ඇඳුමෙන් සිටි පොලිස් කණ්ඩායමක් කොළඹ කොටුව විරෝධතාවයක් පැවැත්වෙන අතර තුර කිසිම නීතිමය ලියවිල්ලක් ඉදිරිපත් නොකර ක්‍රියාකාරිකයෙකු වන නිපුන් අත්අඩංගුවට තැත් කරන ලදී.

## 2022 ඔක්තෝබර්

මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටියේ දි විපක්ෂයේ සමගි ජන බලවේගය සංවිධානය කළ විරෝධතාවයක දී පුද්ගලයන් 15ක් අත් අඩංගුවට ගන්නා ලදී. එම ස්ථානයේම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ නායකත්වයෙන් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ සංවිධානය කළ රැලිය බාධාවකින් තොරව පවත්වන ලදී. ගාලු මුවදොර පිටියේ අරගල විරෝධතාවයේ දි දිවි අහිමි වූවන් සැමරීමේ උත්සවයක් පොලිසියෙන් කඩා කප්පල් කරන ලදී. උත්සවය පැවති ප්‍ර දේශයට ඇතුලු වීමට විරෝධතාකරුවන් බලධාරීන්ගෙන් නිසි අවසරයක් ලබා ගෙන නැතැයි පොලීසිය පැවසීය. අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය සංවිධානය කළ විරෝධතා රැලියක දී කැළණිය විශ්ව විද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ඇතුළත් අඩුම වශයෙන් ශිෂ්‍ය ක්‍රියාකාරීන් 8ටක් පොලිසියෙන් අත් අඩංගුවට ගෙන ඇත. මෑතක පැවති විරෝධතා ව්‍යාපාරයට සම්බන්ධ තරුණ ක්‍රියාකාරිකයෙකු වන ෆයිසාන් අහමඩ් පොලිසියෙන් අත් අඩංගුවට ගෙන පැය 4ත් ප්‍රශ්න කිරීමෙන් පසු නිදහස් කර ඇත. කොළඹ අරගලයේ ක්‍රියාකාරීන්ගේ නිවෙස්වලට පැමිණ පුද්ගලික තොරතුරු රැස් කරන්නේයැයි කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මංත්‍රී මනෝ ගනේෂන් චෝදනා කෙළේය.

## 2022 නොවැම්බර්

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමේ අනතර්ජාතික දිනය සැමරීමට කොළඹ එක්සත් ජාතීන්ගේ කාර්යාලයට පෙළපාලියකින් ගමන් කළ සමගි ජන බලවේගයේ කාන්තා පෙරමුණ වන සමගි වනිතා බලවේගයේ සමහර සාමාජිකාවන්ට පොලීසියෙන් බාධා කර අත් අඩංගුවට ගෙන ඇත. වෙනත් සිද්ධියක දී දිගු කලක් තිස්සේ රඳවා ගෙන සිටින ශිෂ්‍ය ක්‍රියාකාරීන් නිදහස් කරන ලෙස ඉල්ලා විරෝධතා පා ගමනක් පැවැත් වූ කාන්තාවන් දෙදෙනෙකු අත් අඩංගුවට පත් කොට ඇත.

වෘත්තීය සමිති, ශිෂ්‍ය සංගම් සහ දේශපාලන පක්ෂ, රඳවා ගෙන සිටින ශිෂ්‍ය ක්‍රියාකාරිකයන් නිදහස් කරන ලෙසත් ආර්ථික අර්බුදයට විසඳුම් ඉදිරිපත් කරන ලෙසත් ආණ්ඩුවට බල කෙරෙන විශාල විරෝධතාවයක් සංවිධානය කළ විට විරෝධතාවය පැවැත්වීමට ඉඩ නොදෙන බව පවසමින් පොලිසියෙන් අවවාද කෙරෙන ලිපියක් නිකුත් කෙළේය පොලීසිය කඳුලු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කොට විරෝධතාවය නතර කෙළේය. විරෝධතාවය පැවැත්වීමට දිනකට පෙර ආණ්ඩුවේ මංත්‍රීන් විරෝධතාවය හෙළා දැකීමට පුවත් සාකච්ඡාවක් පැවැත් වූ අතර එහි දී එක් මංත්‍රී කෙනෙකු විරෝධතාකරුවන් ද්‍රෝහින්යැයි හැඳින් වූයේය. විරෝධතාවය පැවැත්වීමට දින කීපයකට පෙර වෙළඳ මණ්ඩල කණ්ඩායමක් විරෝධතා පැවැත්වීමෙන් ආර්ථික අර්බුදය විසඳීමට ගන්නා උත්සාහය ව්‍යාර්ථවනු ඇතැයි ප්‍රකාශයක් නිකුත් කරමින් විරෝධතාවය අත් හරින ලෙස ඉල්ලා සිටියහ.

නොවැම්බර් 18 අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය සංවිධානය කළ විරෝධතා පෙළපාලියක් විසිරුවා හැරීමට පොලීසිය නෙලුම් පොකුණ රඟහළ අසළ දී කඳුලු ගෑස් සහ ජල ප්‍රහාරයක් එල්ල කරන ලදී. අන්තර්ජාතික බලපෑම් කරන ලෙස ඉල්ලා එක්සත් ජාතින්ගේ පරිශ්‍රයට ඇතුලු වීමට තැත් කළ විරෝධතාකරුවන් වැළැක්වීමට පොලිසිය යොදවා තිබිණ. නොවැම්බර් 11 කොළඹ එක්සත් ජාතින්ගේ කාර්යාලය අසළ සත්‍යාග්‍රහයක් පැවැත්වීමට ගත් උත්සාහය පොලීසියෙන් විසිරුවා හරින ලදී. මහජන ආරක්ෂාව පිළිබඳ ඇමති මෑතක පැවති අරගලයේ නායකයෙකු වන ජීවන්ත පීරිස්

පියතුමා අත් අඩංගුවට ගැනිමට පොලිස්පතිට නියෝග කර ඇතැයි 'අරගලයේ නීතිඥයන්" සංවිධානයේ නිතිඥ මනෝජ් නානායක්කාර චෝදනා කෙළේය. නොවැම්බර් 16 ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය ඉදිරි පිට පැවැත් වූ විරෝධතාවයක දී මෙගපෝන් භාවිතය තහනම් කර ඇති නිසා ඉන් වැළකී සිටින්නැයි උසස් පොලිස් නිලධාරියෙකු විරෝධතා කරුවන්ට දන්වා ඇත. නොවැම්බර් 27 දින හිටපු දෙමළ කැරලිකරුවන් ගේ මහාවීර දිනය සැමරීමට මුලතිවු හි පැවැත්වෙන උත්සවයක් සඳහා ඉදි කර තිබූ සැරසිලි පොලිසිය විසින් විනාශ කර දමන ලදී. නොවැම්බර් 26 වැනි දින මඩකලපුවේ සිවිල් සමාජ මණ්ඩපයේ සභාපති එස් සිවයෝගනාතන් ගේ නිවසට ගොස් මහාවීර දිනය නිමිත්තෙන් ඔහුගේ සැලසුම් මොනවාදැයි හඳුනා නොගත් පුද්ගලයන් ඔහුගෙන් විමසා ඇත.

## 2022 දෙසැම්බර්

මිය ගිය අරගලකරුවන් සිහිපත් කිරීමට ගෝටාගෝගම විරෝධතාකරුවන් සංවිධානය කළ උත්සවයේ දී විශාල පොලිස් භට පිරිසක් දක්නා ලදී. අඩු ආදායම්ලාභී පවුල්වල ළමයින් අතර බෙදා දීම සඳහා පොත් සහ ලිපිද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ගෝටාගෝගම පුස්තකාලය මගින් සංවිධානය කළ විට එය වැළැක්වීමට පොලීසිය උත්සාහ කෙළේය. අරගලය හා සම්බන්ධ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෙකු වන ඩිලාන් සේනානායකට දෙසැම්බර් 14 දින කොළඹ නුගේගොඩ තම කාර්යාලයේ දී මුහුණු ආවරණ පැළඳි දෙදෙනෙකු විසින් පිහියෙන් ඇන ඇත.

# 6. නීති සහ ප්‍රතිපත්ති වෙනස්වීම්

**මැතිවරණ කල් දැමීම**

2022 ජනවාරි මස පළාත් පාලන මැතිවරණය තවත් වසරකින් කල් දැමිණ.

**හදිසි තත්වය සහ ඇඳිරි නීතිය**

ශ්‍රී ලංකාවේ පැවති ආණ්ඩු විරෝධි උද්ඝෝෂණ නිසා 2022 අප්‍රේල් සිට ජුලි දක්වා අවස්ථා තුනක දි හදිසි තත්වය ප්‍රකාශ කරන ලදී. ඒ සමගම මහා මාර්ග ඇතුළත් ප්‍රසිද්ධ ස්ථානවල ගැවසීම තහනම් කරන ඇඳිරි නීතිය ද කීප වතාවක්ම පනවන ලදී.

මිරිහාන ආණ්ඩු විරෝධී විරෝධතා ව්‍යාපාරය ඇරඹෙත්ම ජනාධිපති අප්‍රේල් 1 වැනි දා හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කෙළේය.[12] එම නියෝගය 2022 අප්‍රේල් 5 ඉවත් කරන ලදී.[13] අප්‍රේල් 2 වැනිදා කිසිම පුද්ගලයෙකු ප්‍රසිද්ධ මහා මාර්ගයක, දුම්රියක, මහජන පිට්ටනියක, මහජන ක්‍රිඩාංගනයක හෝ වෙනත් ප්‍රසිද්ධ පිට්ටනියක හෝ එවැනි ප්‍ර දේශයක ඇති වෙරළක අප්‍රේල් 2 අ.භා. 6.00 සිට අප්‍රේල් 4 වැනි දා පෙරු 6.00 දක්වා රැඳී නොසිටිය යුතුය. [14] මැයි 6 වැනි දා ජනාධිපති නැවත වරක් හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කළේය.[15] ආණ්ඩුවට හිතවත් මැර කණ්ඩායම් සාමකාමී විරෝධතාකරුවන්ට පහර දීමෙන් පසු රට පුරා හටගත් ප්‍රචණ්ඩ ක්‍රියාවලින් පසුව අවස්ථා ගණනාවක දී ඇඳිරි නීති ගණනාවත් නිකුත් කරන ලදී. මැයි 9 වැනි දා අ.භා. 7.00 සිට මැයි 12 පෙරවරු 7.00 දක්වා ඇඳිරි නිතිය පනවන ලදී.[16] නැවත වරක් මැයි 13 අ.භා.2 සිට මැයි 14 පෙරවරු 6.00 දක්වා ඇඳිරි නීතිය පනවන ලදී.[17] මැයි 14 අ.භා. 6.00 සිට මැයි 15 පෙරවරු 5.00 දක්වා නැවත වරක් ඇඳිරි නිතිය පනවන ලදී.[18] මැයි 16 අ.භා. 11.00 සිට මැයි 17 පෙරවරු 5.00 දක්වා ඇඳිරි නීතිය නැවත පනවන ලදී.

ජුලි 17 දින වැඩ බලන ජනාධිපති රනිල් වික්‍රමසිංහ හදිසි තත්වය ප්‍රකාශයට පත් කෙළේය.[19]

---

12 12 http://documents.gov.lk/files/egz/2022/4/2273-86_E.pdf
13 http://documents.gov.lk/files/egz/2022/4/2273-86_E.pdf
14 http://documents.gov.lk/files/egz/2022/4/2273-86_E.pdf
15 http://documents.gov.lk/files/egz/2022/5/2278-22_E.pdf
16 http://documents.gov.lk/files/egz/2022/5/2278-22_E.pdf
17 **http://documents.gov.lk/files/egz/2022/5/2279-11_E.pdf**
18 http://documents.gov.lk/files/egz/2022/5/2279-11_E.pd
19 http://documents.gov.lk/files/egz/2022/7/2288-30_E.pdf

## සන්නද්ධ හමුදා කැඳවීම

ජුලි සහ සැප්තැම්බර් හැරුණු විට වසර පුරාම මහජන සාමය පවත්වා ගැනීමට සන්නද්ධ හමුදා කැඳවීමේ ගැසට් නිවේදන මාසිකව නිකුත් කරන ලදී. මහජන ආරක්ෂක ආඥාපනතේ 12 ඡේදය යටතේ (40 පරිච්ඡේදය) සිවිල් කටයුතුවලටමැදිහත්වීමේ අතිරේක බලතල හමුදාවට පැවරීමට ජනාධිපතිට පවරා ඇති ප්‍රතිපාදන අනුව මෙම නියෝග නිකුත් කරන ලදී. එවැනි ගැසට් නිවේදන වසර ගණනාවක් පුරාම නිකුත් කර ඇත.

## තොරුතුරු දැනගැනීමේ අයිතිය සීමා කිරීම

ජනමාධ්‍යවේදියෙකු තොරුතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පදනම්ව පාර්ලිමේන්තු මංත්‍රීන්ගේ වත්කම් ප්‍රකාශ ලබා ගැනීමට තොරතුරු දැනගැනීමේ කොමිසමට කරන ලද ඉල්ලීමක් අනුව එම කොමිසමෙන් කරන ලද නියෝගයට එරෙහිව පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය 2022 ජනවාරි මාසයේදී අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කෙළේය. තොරතුරු දැනගැනීමේ අයිතිය සීමා කෙරෙන සහ ජන මාධ්‍යවේදීන්ට තොරතුරු ලබා ගැනීම සීමා කෙරෙන පුද්ගලික දත්ත ආරක්ෂා කිරීමේ පනතක් පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගන්නා ලදී. තොරතුරු ලබා ගැනීමේ කොමිසම ඉදිරියේ සැප්තැම්බර් මස පැවති විභාගයක දී ත්‍රස්තවාදය වැළැක්විමේ පනත යටතේ අත් අඩංගුවට ගෙන රඳවා ගෙන ඇති පුද්ගලයන් පිළිබඳ විස්තර ලබා දීමට පොලිසිය ප්‍රතික්ෂේප කෙළේය. එම විභාගයේ දී පොලිස්පති වෙනුවෙන් පෙනී සිටි පොලිස් පරීක්ෂක සහ නීතිඥ වසන්ත කුමාර කොටියකුඹුර එම තොරතුරු ලබා දිම ජාතික ආරක්ෂාවට බරපතළ තර්ජනයක් වනු ඇතැයි පැවසුවේය. මැතක පැවති ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට සහභාගීවීම නිසා බොහෝ පිරිසක් දරදඬු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගෙන තිබිණ.

## ප්‍රතිත්‍රස්ත නීති

2022 ජනවාරි මස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට ආණ්ඩුව සංශෝධන කීපයත් ගැසට් කරන ලදී. මානව අයිතිවාසිකම් කණ්ඩායම් පවසන ආකාරයට මෙම සංශෝධන අවම මට්ටමේ ඒවා වන අතර ප්‍රමාණවත් නොවන බවත් එම පනතේ මූලික ගැටලුවලට විසඳුම් නොවන බවත් පෙන්වා දෙති. 2022 අගෝස්තු මස ශ්‍රී ලංකාවේ අධිකරණ ඇමති  විවාදයට තුඩු දී ඇති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට වඩාත් ලිහිල් ප්‍රතිපාදන සහිත නව ජාතික ආරක්ෂා පනතක් ගෙන එන බව ප්‍රකාශ කෙළේය.

## ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදී කටයුතුවලට මුදල් සැපයීම තහනම් කිරීමේ ලැයිස්තුව

ශ්‍රී ලංකාව එක්සත් රාජධානිය පදනම්ව ඇති ගෝලීය තමිල් සංසදය ( GTF) ඇතුළත් සංවිධානය හයක් සහ ත්‍රස්තවාදයට සම්බන්ධයැයි සහ ත්‍රස්තවාදි කටයුතුවලට මුදල් ලබා දෙන්නේයැයි සඳහන් පුද්ගලයන් 316 ක් ත්‍රස්තවාදී ලැයිස්තුවකින් ඉවත් කරන ලදී. ඒ අතර කවියෙකු වන අහ්නාෆ් ජසීම් 2012 අංක 1 එක්සත් ජාතීන්ගේ රෙගුලාසි පනත යටතේ ත්‍රස්තවාදි පුද්ගලයන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරන ලදී.

## කොළඹ නගරය තුළ විරෝධතා පැවැත්වීම වැළැක්වීමට අධි ආරක්ෂක කලාප ප්‍රකාශයට පත් කිරීම

සැප්තැම්බර් 23 වැනි දා කොළඹ අධි ආරක්ෂක කලාප ප්‍රකාශයට පත් කරමින් රාජ්‍ය රහස් පනත යටතේ ගැසට් පත්‍රයක් නිකුත් කරන ලදී. ඊට ආණ්ඩුවේ ප්‍රධාන ගොඩනැගිලි රාශියක් ඇතුළත් විය. මානව හිමිකම් කොමිසම පුවත් නිවේදනයක් නිකුත් කරමින් රාජ්‍ය රහස් පනත අධි ආරක්ෂක කලාප ප්‍රකාශයට පත් කිරීමට යොදා ගත නොහැකි බව සඳහන් කෙළේය. එක්සත් ජාතීන්ගේ දංගම් පැවැත්වීම පිළිබඳ විශේෂ වාර්තාකරු ක්ලෙමන්ට් වූලි ට්විටර් පණිවුඩයක් නිකුත් කරමින් සිය කණස්සල්ල පළ කෙළේය.

## පුනරුත්ථාපන පනතේ කාර්යංශය

සැප්තැම්බර් මස පුනරුත්ථාපන පනතේ කාර්යංශය නමින් විවාදයට තුඩු දුන් කෙටුම් පත් පනතක් ඉදිරිපත් කරන ලදී. මානව අයිතිවාසිකම් ක්‍රියාකාරිකයන් සහ තවත් අය මෙම පනතින් ඉලක්ක කර ගෙන ඇත්තේ මෑතක දී විරෝධතා උද්ඝෝෂණවලට සහභාගී වූ අය අධිකරණ ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකර බලහත්කාරයෙන් පුනරුත්ථාපන ක්‍රියාවලියකට පත් කිරීමයැයි පෙන්වා දුන්හ.

## අත්‍යවශ්‍ය සේවා

ජුලි මස මුල දී සේවාවන් කීපයක් අත්‍යවශ්‍ය සේවා ලෙස නම් කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. මෙවැනි ප්‍රකාශ වෘත්තීය ක්‍රියා මාර්ග වැළැක්වීමේ සුප්‍රකට පියවරකි. වානිජ අගනුවර කොළඹ දින කීපයක් ඇඳිරි නීතිය පනවන ලදී. විදුලිය සැපයීම, ඉන්ධන සහ පැට්‍රෝලියම් සැපයීම සහ බෙදා හැරීම, සෞඛ්‍ය සේවා සැපයීම හා සම්බන්ධ සියලු සේවා අත්‍යවශ්‍ය සේවායැයි ප්‍රකාශ කරමින් ජනාධිපති ඔක්තෝබර් 3 ගැසට් නිවේදනයක් නිකුත් කෙළේය. ඉල්ලීම් කීපයක් මුල් කර ගනිමින් ඒකාබද්ධ තැපැල් වෘත්තීය සමිති සන්ධානය දෙසැම්බර් 11 අ.භා.4.00 සිට 12 වැනිදා මධ්‍යම රාත්‍රිය දක්වා සංකේත වැඩ වර්ජනයක යෙදෙන බව ප්‍රකාශ කිරීමත් සමග තැපැල් කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගේ නිවාඩු අවලංගු කරන බව දෙසැම්බර් 12 තැපැල් දෙපාර්තමේන්තුව නිවේදනය කෙළේය. විදුලිය සැපයීම, ඉන්ධන සහ පැට්‍රෝලියම් සැපයීම සහ බෙදා හැරීම, සෞඛ්‍ය සේවා සැපයීම හා සම්බන්ධ සියලු සේවා අත්‍යවශ්‍ය සේවායැයි ප්‍රකාශ කරමින් ජනාධිපති දෙසැම්බර් 3 ගැසට් නිවේදනයක් නිකුත් කෙළේය. අත්‍යවශ්‍ය සේවා ලෙස ප්‍රකාශ කිරීම වෘත්තීය සමිති ක්‍රියා මාර්ග වැළැක්වීමට බොහෝ විට යොදා ගන්නා උපාය මාර්ගයකි.

# 7. සිවිල් සමාජය මර්දනය කිරීම

**විරෝධතා සහ වෘත්තීය සමිතිවලට එරෙහි ප්‍රකාශන**

අධිකරණ ඇමති වැඩ වර්ජන තහනම් කළ යුතුයැයි ද ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගෙන ආ යුතුයැයි ද සඳහන් කෙළේය. 2022 පෙබරවාරි මස මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මංත්‍රී සහ වරාය සහ නාවික ඇමති ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් වෘත්තීය සමිති සහ විරුද්ධ දේශපාලන පක්ෂ ශ්‍රී ලංකාවට එක්තරා ආකාරයක වසංගතයක්ව ඇතැයි ප්‍රකාශ කෙළේය. එම මාසයේම පාර්ලිමේන්තු මංත්‍රී තිස්ස කුට්ටිආරච්චි ජනතාව වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන්ට පහර දිය යුතුයැයි විවාදයට තුඩු දුන් ප්‍රකාශයක් කෙළේය. මාර්තු මස ජනාධිපති කාර්ය සාධක බලකායක සභාපති කෙනෙකු වන මතභේදයට ලක්ව ඇති භික්ෂුවක් වන ඥානසාර පුවත් පත් සාකච්ඡාවක දී ජනාධිපති හිට්ලර් කෙනෙකු විය යුතුයැයි ද විරෝධතා සහ වෘත්තිය සමිති ක්‍රියා මාර්ග තහනම් කළ යුතුයැයිද යෝජනා කෙළේය.

මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් ගෙන් පලිගැනීම

ජනාධිපති රනිල් වික්‍රමසිංහ නොවැම්බර් 24 පාර්ලිමේන්තුව අමතමින් මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සරදමට ලක් කොට මානව හිමිකම් කොමිසමට පොලිස් නිලධාරීන්ගේ සහ වෙනත් රජයේ ආරක්ෂක නිලධාරීන්ගේ රාජකාරි කටයුතුවලට බාධා කිරීමට අයිතියක් නැතැයි කිවේය. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය 2022 පෙබරවාරි මස නිවේදනයක් නිකුත් කරමින් හිටපු මානව හිමිකම් කොමසාරිස්වරියක සහ දැනට නීලන් තිරුචෙල්වම් භාරයේ සභාපතිනිය අම්බිකා සත්කුනනාදන් 2022 ජනවාරි 27 යුරෝපා සංගමයේ පාර්ලිමේන්තු අනු කමිටුවක් ඉදිරියේ දෙන ලද සාක්ෂි නොමග යවන සුලුයැයි ප්‍රකාශ කෙළේය.

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන්ට යුක්තිය ඉටු කරන්නැයි හඬ නැගූ ක්‍රියාකාරිකයෙකු වන ශෙහාන් මාලක ගමගේ 2022 පෙබරවාරි මස පොලීසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අත් අඩංගුවට ගන්නා ලදී. ජීවිතයට ඇති අයිතිය සංවිධානයේ ( තේසීය වල්වුරිමයියක්කම්) සභාපති මන්නාරමේ වී ඇස් සිවකරන් කොළඹ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට කැඳවා පැය 5ක් තිස්සේ ප්‍රශ්න කර ඇත. සමාජ ක්‍රියාකාරික මනෝරමා වීරසිංහ හේතුවක් නොදන්වාම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳ වූයේය. හඳුනා නොගත් පුද්ගලයන් සිරකරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ සංවිධානයේ ලේකම් සුදේශ් නන්දිමාල් ගේ පෞද්ගලික තොරතුරු පරික්ෂා කර ඇත.



වි. එස් සිවකරන් මාධ්‍ය සාකච්ඡාවක් අතරතුර. ඡයාරූපය Tamil Guardian අනුග්‍රහයෙනි.

පොලීසියේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ නිලධාරීන් රාජ්‍ය නොවන සංවිධාන ගණනාවකට ගොස් ඒවායේ කාර්ය මණ්ඩලවල සහ අරමුදල් ලබා දෙන ආයතනවල විස්තර ඉල්ලා ඇත. මඩකලපුව දිස්ත්‍රික් සිවිල් සමාජ සංවිධාන සංසදයේ සභාපති සහාරත්නම් සිවයෝගනාදන් සැප්තැම්බර් සහ ඔක්තෝබර් යන මාස දෙකේම පොලීසියට කැඳවා ඇත. සිවිල් සමාජ ක්‍රියාකාරික විරන්ත අමරසිංහ 2022 ජුලි 9 වැනි දා විරෝධතාවයේ දි හටගත් ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සාවදය ලෙස සම්බන්ධ කර අත් අඩංගුවට ගැනීමට පොලීසිය පරීක්ෂණ කටයුතු සිදු කරන්නේයැයි එය වැළැක්වීමට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොණු කෙළේය. 2022 නොවැම්බර් 28 දින ධීවරයින් සංවිධානය කළ විරෝධතාවයක් තම සමාජ මාධ්‍ය යේ පළ කිරීමට වාර්තා කිරීමේ දී උණුසුම් තත්වයක් ඇති විය. ඔහු විරෝධතාවය වාර්තා කිරීමේ දී ආණ්ඩුවට පක්ෂපාතී මැර කණ්ඩායමක් තර්ජනය කොට දුර කතනය පැහැර ගත්තේයැයි ද පොලිස් නිලධාරියෙකු ඔහු අත් අඩංගුවට ගන්නේයැයි තර්ජනය කළ බවත් පුවත් සාකච්ඡාවක දී පැවසුවේය.

# 8. වෙනත් සිද්ධීන්

2022 බෙරවාරි මස හම්බන්තොට ප්‍රබල දේශපාලකයෙකු තමා තනතුරෙන් ඉවත් කිරීමට උත්සාහ ගන්නේයැයි ඉඩම් කොමසාරිස් කීර්ති ගමගේ පැවසුවේය. එම මාසයේ දීම අගමැති සහ ඇමතිවරුන් ලිට්‍රෝ ගෑස් සමාගමේ සහ මහජන උපයෝගිතා කොමිසමේ සභාපතීන් මාධ්‍ය සාකච්ඡාවලදී සහ පුවත් සාකච්ඡාවලදී ආණ්ඩුව විවේචනය කරන නිසා ඔවුන්ට එරෙහිව පියවර ගැනීමේ වැදගත්කම සාකච්ඡා කළ බව වාර්තාවේ. විරෝධතාකරුවන් බිය ගැන්වෙන ආකාරයෙන් අංක තහඩු නැති මුහුණු ආවරණය කර ගත් මෝටර් සයිකල් ධාවනය කළ අවි ගත් හමුදා කණ්ඩායමක් නතර කොට ප්‍රශ්න කළ පොලිස් නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් පවත්වන්නැයි හමුදාපති පොලිස්පතිගෙන් ඉලලා සිටියේය. සැප්තැම්බර් මස සෞඛ්‍ය ඇමති ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂවරුන්ගේ සංගමයේ සභාපති ඇම් ජී උපුල් රෝහණට විරුද්ධව පියවර ගන්නා බවට තර්ජනය කෙළේය. උපුල් රෝහණ ආණ්ඩුවෙන් පෝෂණ අතිරේකයක් වශයෙන් බෙදා දෙන ත්‍රිපෝෂවල ඇප්ලොටොක්සින් අධික ප්‍රමාණයක් පවතින බව සොයා ගෙන ඇතැයි පැවසීම ඊට හේතු විය. දෙමළ වාර්ගික සුළුතරයට අයත් යාපනය දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එම් ඒ සුමන්තිරන් සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මංත්‍රී ෂනක්‍යාන් රාසපුතිරන් රාසමානික්කම් රැස්වීමකට සහභාගිවීමට වාහන දෙකකින් ගමන් කරන් විට බුද්ධි නිලධාරීන් ඔවුන් පසු පස ආ බව වාර්තා කළහ.

පෙබරවාරි මස සුදු වෑන් රථයකින් පැමිණි රාජ්‍ය බුද්ධි අංශයේයැයි හඳුන්වා ගත් කණ්ඩායමක් ඉලංකෙයි තමිල් අරසු කච්චි දේශපාලන පක්ෂයේ තරුණ අංශයේ සහකාර ලේකම් නිෂාන්තන් පැහැර ගැනීමට උත්සාහ කළහ. 2022 ජුනි 28 වැනි දා සමාජ ක්‍රියාකාරිකයෙකු වන මින්ශාත් මුබාරක් බේරුවල ඉන්ධන පිරවුම් හලක සිටින විට පොලීසියෙන් දරුණු ලෙස පහර දී ඇත. සැප්තැම්බර් මස මඩකලපුවේ මානව අයිතිවාසිකම් ක්‍රියාකාරිකයන් වන ලක්ෂමනරාජිනි ජෙයප්‍රගාෂ් සහ දෙමළ ජාතික සන්ධානයට සම්බන්ධ කන්තයියා කලෙයිවනි කොළම ප්‍රතිත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට කැඳවා ඇත.